# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,584 — 1958 නොවැම්බර් 14 වැනි සිකුරාද—14.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 2505 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 2512 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 2515 | රට බිම් විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කල ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 2522 | විවිධ දැන්වීම් ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුදැ නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු සථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරු වලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරු වලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු හැඟෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

ඒ ඉල්ලුම් පත්‍ර භාර ගැනීම මැනවයි නිර්දේශ කරන්නේ නැත්නම්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගින් එවනු ලැබ නියමිත දිනට පසුව මේ කාර්‍යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

7. රජයේ ගැසට් පත්‍රයේ i වැනි කොටසේ (ii) වැනි ඡේදයේ පටන් ගැන්මේ රජයේ සේවයේ තනතුරු පිළිබඳ සාමාන්‍ය කොන්දේසි බලන මෙන් ඔබේ අවධානය යොමු කරනු ලැබේ. ඒ කොන්දේසි මෙම පළකිරීමේ සඳහන් වූ නියමයන්ට අතිරේකව යෙදෙනු ඇත.

8. ඉල්ලුම් පත්‍රයේ ඒ පිළිබඳ අනික් කවර හෝ ලියකියමන් එවිය යුත්තේ ජී. ඊ. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත මිස මේ දෙපාර්තමේන්තුවේ අනික් කවර හෝ නිලධාරියකුට පුද්ගලික වශයෙන් නො වේ. මුද්‍රිත ඉල්ලුම් පත්‍ර මේ කාර්‍යාලයෙන් ලබා ගත නො හැකි ය. තවද, එ බඳු ඉල්ලුම් පත්‍ර පිළිබඳ ඉල්ලීම් භාර ගනු නො ලැබේ. මෙහි පහත දී තිබෙන ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය, ඉල්ලුම් කරුවන් විසින් පිටපත් කර ගත යුතු ය.

9. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු නො ලැබේ. සාමාන්‍ය තැපෑලෙන් එවන ලද ඉල්ලුම් පත්‍ර නො ලැබී යාම ගැන මේ කාර්‍යාලය වග කියනු නො ලැබේ.

10. මෙම නිවේදනයේ නියමයන්ට සෑම අයුරින් ම අනුකූල නො වන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

එස්. එෆ් ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1958 නොවැම්බර් මස 11 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ශාරීරික අභ්‍යාස උපදේශක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නාමය :————.

———— මහත්මයා/මහත්මිය/මෙනවිය

2. ලිපිනය :————.

————.

3. (i) උපන් ස්ථානය හා දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් මීට අමුණිය යුතුය)
(ii) වයස :————.

4. උපන් ස්ථානය—
(අ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.

5. (අ) ඉල්ලුම්කරුගේ ජාතිය :————.
(ආ) ලාංකිකයෙකු නම්,
ලියා පදිංචි කිරීමෙන්ද නැතහොත් පරම්පරාවෙන්ද යන වග :————.

6. දැනට යෙදී සිටින රක්ෂාව හා ඒ රක්ෂාවේ සේවා සටහන පිළිබඳ විස්තර (ශික්ෂකයකු නම් ලියාපදිංචි කළ අංකය. දැනට ලබන වාර්ෂික වැටුප හා වැටුප් ක්‍රමය ආදිය සඳහන් කළ යුතුය) :————.

7. උසස්ම අධ්‍යාපන සුදුසුකම :————.
(i) සිංහල/දෙමළ :————.
(ii) ඉංග්‍රීසි :————.

8. ශාරීරික අධ්‍යාපන පිළිබඳ වෘත්තීය සුදුසුකම් : (අභ්‍යාසය ලැබූ ස්ථානය හා කාලය සහ සහතික පත්‍රයේ වර්ගය, සහතික පත්‍ර පිටපත් වලින් මෙය සනාථ කළ යුතුය.) :————.

9. විශෙෂ හිමිකම්, සුදුසුකම් සහ/හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පළපුරුද්ද ගැන විස්තර :————.

10. අධ්‍යාපනය ලැබූ පාඨශාලාව හා ඉල්ලුම්කරු එහිදී සහභාගි වූ විෂයමාලාවෙන් බාහිර ක්‍රියාකාරිත්වයන්ගේ සංක්ෂේප විස්තරයක් :————.

11. චරිත සහතික ලබා ගත් අයගේ නම් හා ලිපින :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර ලත් ශික්ෂකයන් සේවයට බඳවා ගන්නා ක්‍රමය

(සිංහල) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හා (ඉංග්‍රීසි) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වූ තැනැත්තන් ගෙන් සිංහල භාෂා මාධ්‍යයෙන් උගන්වන පාඨශාලාවල අනුපිළිවෙලින් සිංහල උපගුරු හා ඉංග්‍රීසි උපගුරු වශයෙන් ඇති විය හැකි පුරප්පාඩු සඳහා ඉල්ලුම් පත්‍ර එවන මෙන් ආරාධනය කරනු ලැබේ.

2. මෙහි පහත දැක්වෙන පෝරමය අනුව ම ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. තවද, ඉල්ලුම්කරුගේ අත් අකුරෙන් ඉල්ලුම් පත්‍රය ලිවිය යුතුය.

3. "පුරප්පාඩු" යන වචනය ලිපි කවරයේ ලියා මෙහි පහත දැක්වෙන පරිදි අධ්‍යාපන නිලධාරීන් වෙත රෙජිස්තර තැපෑලෙන් ඉල්ලුම් පත්‍ර යැවිය යුතුය :—

(1) බස්නාහිර පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, බ.ප., තර්ස්ටන් පාර, කොළඹ

(2) මධ්‍යම පළාත .. අධ්‍යාපන නිලධාරිවරයා, ම.ප., මහනුවර

(3) දකුණු පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, ද.ප., ගාල්ල

(4) සබරගමුව පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, සබරගමුව පළාත, රත්නපුර

(5) වයඹ පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, ව.ප., කුරුණෑගල

(6) ඌව පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, ඌව පළාත, බණ්ඩාරවෙල

(7) උතුරු මධ්‍යම පළාත ... අධ්‍යාපන නිලධාරිවරයා, උ.ම.ප., අනුරාධපුර

(8) ගල්ඔය සංවර්ධන මණ්ඩල යට අයිති ප්‍රදේශය හා මඩකලපු දිස්ත්‍රික්කය ... දිස්ත්‍රික්ක පරීක්ෂකවරයා, අම්පාරේ

(9) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ... දිස්ත්‍රික්ක පරීක්ෂකවරයා, පොළොන්නරුව

(10) උතුරු පළාත .. අධ්‍යාපන නිලධාරිවරයා, උ.ම.ප., අනුරාධපුරය

4. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය 5. 12. 58 වේ. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් එක් ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයක් තෝරා ගත යුතුය. ඉල්ලුම්කරුවකු විසින් එක් ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයකට වැඩි ගණනක් තෝරා ගතහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂෙප කරන්නට පුළුවන.

6. එක් ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයක් තෝරා ගත යුත්තේ මෙහි පහත දැක්වෙන කවර හෝ හේතුවක් නිසාය :—

(අ) උප්පැන්න සහතිකයකින් ඔප්පු කළ හැකි පරිදි, තෝරා ගනු ලැබූ ප්‍රදේශයේ ඉල්ලුම්කරු ඉපදී සිටීම ;

(ආ) තෝරාගනු ලැබූ ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයේ පිහිටි පාසැලකින් ඉල්ලුම්කරු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටීම ;

(ඉ) ඉකුත් වූ 5 වස තුළ තෝරා ගනු ලැබූ ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයේ 3 වසක් ඉල්ලුම්කරු පදිංචි ව සිටීම. ගෘහමූලික ලැයිස්තුවල සහතික කරනු ලැබූ පිටපත් ඉදිරිපත් කිරීමෙන්, නියම කළ විටෙක, ඒ බව ඔප්පු කළ හැකි විය යුතුය. පෙර සඳහන් 3 වැනි ඡේදයේ 7-10 දක්වා වූ දිස්ත්‍රික්කයන්හි ඉකුත් වූ 5 වස තුළ 2 වසක් පදිංචිව සිටීම සෑහේ.

7. ඉල්ලුම්කරුවකු විසින් එක් ඡන්දදායක දිස්ත්‍රික්ක ප්‍රදේශයක් තෝරා ගත් විට, පසු අවස්ථාවක, ඔහුට හෝ ඇයට ඒ ප්‍රදේශය වෙනස් කරන්නට අවසර දෙනු නො ලැබේ.

8. 1940ට පෙර ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් අය, ඉකුත් වූ වර්ෂ 8 තුළ යටත් පිරිසෙයින් එක් වර්ෂයක්වත් රජයේ හෝ උපකෘත පාඨශාලාව පිළිගත් ශික්ෂකයන් වශයෙන් සේවය කර නැත්නම්, ඉල්ලුම් පත්‍ර එවීමට සුදුසු නො වෙත්.

9. ඉල්ලුම්කරුවකුට ඉංග්‍රීසි උපගුරුවරයකු වශයෙන් පමණක් නොව, සිංහල උපගුරුවරයකු වශයෙන් ද ලියාපදිංචි කිරීමට තහනමක් නැත.

10. ලංකාවේ එක් එක් ඡන්දදායක දිස්ත්‍රික්කය වෙනුවෙන් අධ්‍යාපන නිලධාරිවරයා විසින් තබනු ලබන ලැයිස්තුවක ඉල්ලුම් කරුවන් ගේ නම් ලියාපදිංචි කරනු ලැබේ. විභාගයෙන් සමත් වූ දිනය අනුව පිළියෙල කරන ලද ලැයිස්තුවේ අනුපිළිවෙළ අනුව, ඉල්ලුම් කරුවන්ට පුරප්පාඩු පිරිනමනු ලැබේ.

11. 31. 1. 59 වන දින හෝ ඊට පෙර ලැයිස්තුව පිළියෙළ කොට සම්පූර්ණ කරනු ලැබේ. ඊට පසු පරීක්ෂා කර බැලීම සඳහා නියමිත කාර්යාලයේ ලැයිස්තුව විවෘතව තබනු ලැබේ.

12. පත්වීමක් දීමට පෙර මේ දැන්වීමේ 6 වැනි ඡෙදයේ අසා තිබෙන කරුණු ගැන සාක්ෂි අධ්‍යාපන නිලධාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එබඳු සාක්ෂි ඉල්ලුම් පත්‍රය සමඟ එවිය යුතු නො වේ.

13. ඉහත විස්තර කළ පරිදි ලියාපදිංචි කරන කවර හෝ තැනැත්තකුට හෝ තැනැත්තියකට හිමිකමක් වශයෙන් රක්ෂාව දීමට කිසිම පොරොන්දුවක් නැත.

14. පත්වීමක් දීමට යෝජනා කරන ලද දිනයේ සිට මාසයක් ඇතුළත එය භාර නො ගත්තෝ නම්, පත්වීම අවලංගු කරනු ලැබේ.

15. ඕනෑම ඉල්ලුම් පත්‍රයක් ස්වකීය අභිමතය අනුව ප්‍රතික්ෂෙප කිරීමට අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට බලය තිබේ.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

## සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර පෝරමයයි

### ඡන්දදායක දිස්ත්‍රික්කයේ ඉංග්‍රීසි උපගුරුවරයකු/සිංහල උප ගුරුවරයකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය

(ඉල්ලුම්කරුගේ අත් අකුරින් පිරවීම පිණිසය)

1. සම්පූර්ණ නාමය (අ) පෙළපත් නාමය :————.
(ආ) අනිත් නම් :————.
2. 58.10.30 වන දිනට වයස අවුරුදු හා මාස :————.
3. ස්ථිර තැපැල් ලිපිනය :————.
4. ඔබ සමත් වී තිබෙන විභාගය හා සමත් වූ වර්ෂය :————.
5. සමත් වූ විභාගය ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය නම්, ඉංග්‍රීසි භාෂාවෙන් සහ හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ඔබ ලබා තිබේද ? :————.
6. 1957 දෙසැම්බර් මස සහ ඊට පසු පවත්වන ලද පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයක දී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ඔබ ලබා ඉංග්‍රීසි උපගුරුවරයකු වශයෙන් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් වන්නේ නම්, ඉංග්‍රීසි සඳහා ඔබ ගත්තේ "ඒ" නිර්දේශ පත්‍රය හෝ "බී" නිර්දේශ පත්‍රය ද යන වගත් ඉංග්‍රීසියෙන් ඔබ සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබේද යන වගත් සඳහන් කරනු මැනවි.
7. ලියාපදිංචි කිරීම සඳහා ඔබ හිමිකම් දක්වන්නේ කවර හේතුවක් නිසාද ? ඔබ සම්බන්ධයෙන් නො යෙදෙන හේතූන් කපා දමන්න.
(අ) උපන් ස්ථානය :————.
(ආ) විභාගයෙන් සමත් වූ පාසැල :————.
(ඇ) ඉහත සඳහන් වූ 6 (ඉ) ඡෙදයේ දක්වා තිබෙන පරිදි, ස්ථිර පදිංචිය :————.
8. ඔබේ නම ලියාපදිංචි කිරීමට ඔබට වුවමනා කරන ඡන්දදායක දිස්ත්‍රික්කය :————.
9. මෑතදී සහතික ලබාගත් දෙදෙනකුගේ නම් : (එබඳු සහතික වල පිටපත් අමුණන්න) :————.
10. අතීතයේදී රජයේ සේවයෙන් ඔබ පහ කරනු ලැබ හෝ සේවය නවත්වනු ලැබ සිටී නම්, ඒ පිළිබඳ විස්තර දින ඇතුව සඳහන් කරන්න :————.
11. කවර හෝ වරදක් සම්බන්ධයෙන් උසාවියකදී ඔබ වරදකරුවී සිටී නම්, ඒ පිළිබඳ විස්තර දින ඇතුව සඳහන් කරන්න.
————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් ඉහත ප්‍රකාශ කරන්නට යෙදුනු කරුණු සත්‍ය බව මම මෙයින් සහතික කරමි. ඉහත සඳහන් කවර හෝ කරුණක් සාවද්‍ය වුවහොත්, මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂෙප කරනු ලැබීමට පුළුවන් බව මම දනිමි. තවදුරටත් අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ තීරණයට අනුකූල වන්නට මම එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### ලයිනෝ ඔපරේටර් වරයන් තිදෙනෙකු සහ මොනෝ කී බෝඩ් ඔපරේටර්වරයෙකු සඳහා ස්ථිර පත්වීම්

රජයේ මුද්‍රණාලයේ ලයිනෝ ඔපරේටර්වරයන් තිදෙනෙකුගේ සහ මොනෝ ඔපරේටර්වරයකුගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1958 නොවැම්බර් 28 වැනි දින හෝ ඊට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතුය. නියමිත ආකෘති පත්‍රයේ සකස් වී නැති ඉල්ලුම් පත්‍ර භාර ගනු නො ලැබේ.

2. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.—ආණ්ඩුවේ සේවයට කෙරෙන පත් කිරීම් පිළිබඳව, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි කොටසේ සඳහන් වන සාමාන්‍ය නීති රීති ඉල්ලුම් කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය.

3. අයදුම්කරුවන් සාර්ථක ලෙස අවුරුදු පහක ආධුනික සේවා කාලයක් සම්පූර්ණකොට තිබිය යුතුය.

4. වැටුප්.—II වන ශ්‍රේණියේ ස්ථිර තනතුර සඳහා අදාල වැටුප් ක්‍රමය නම්: රුපියල් 1,380—42—රුපියල් 1,842. ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව සහ තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මෙම දීමනා ආණ්ඩුවේ රෙගුලාසීන්ට අනුව ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පෝදිසි කාලයක් යටතේ පත්කර ගනු ලැබේ.

5. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට සහ දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ වැඩ කිරීමට නියම කරනු ලැබේ.

6. ආදර්ශ ආකෘති පත්‍රයේ 8 (ඇ) දරණ ඡේලියෙන් අවශ්‍යයයි පෙන්වා ඇති, ළඟදී ලබා ගන්නා ලද සහතික පිටපත් (ඒවා ආපසු එවනු නො ලැබේ.) තුනක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුය. යටත් පිරිසෙයින් ඉන් දෙකක්වත් අයදුම්කරුගේ චරිතය සහ ඍජු භාවය පිළිබඳ සහතික විය යුතුය. ආකෘති පත්‍රය පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් කර ගතයුතුය. මුද්‍රිත ආකෘති පත්‍ර නො මැත. ඉල්ලුම් පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුය. පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ වෙන කවර නිලධාරියකුගේ හෝ නමට නො එවිය යුතුය.

7. කිසියම් අයදුම්කරුවකු වෙනුවෙන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති හෝ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියකු සම්මුඛව සාකච්ඡා කිරීමට උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුසු බවට පත්වන්නේය.

8. යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොර තුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරණු ලැබීමටත් ඉඩ තිබේ.

9. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර හෝ ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරණු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1958 නොවැම්බර් 5 දින,
කොළඹ, රජයේ මුද්‍රණාලයේදී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### ලයිනෝ ඔපරේටර්වරයෙකුගේ, මොනෝ ඔපරේටර්වරයකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම :————.
(2) ලිපිනය :————.
(3) (අ) ඉල්ලුම්කරු උපන් දිනය සහ ගම :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ගම :————.
ඉල්ලුම්කරුගේ වයස : අවුරුදු............මාස.............
(5) විවාහක හෝ අවිවාහක බව :————.
(6) ජාතිය :————.
(අ) ලාංකිකයකු නම් ලියාපදිංචිවීමෙන් ද, පරම්පරාවෙන් ද යන වග :————.
(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ඔබ ලාංකිකයකු නොවන්නෙහි නම් ලියාපදිංචිවීමෙන් ලංකා පුරවැසි බව ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත ඉල්ලුම් කර යැවූවෙහි ද ? මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
(7) ලයිනෝ ඔපරේටර්වරයකු/මොනෝ ඔපරේටර්වරයකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.
(8) පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුයි :—
(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;
(ඇ) චරිතය හා දක්ෂතාවයන් පිළිබඳ සහතික තුනක් ;
(ඈ) ඉහත සඳහන් අංක 7 දරන තීරයේ කරුණු සනාථ කිරීම සඳහා සහතික.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### දෙවැනි ශ්‍රේණියේ රසායනාගාර සහායක තනතුරු

දෙවැනි ශ්‍රේණියේ රසායනාගාර සහායක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වේතනය.**—මෙම තනතුරට අදාළ පඩි ක්‍රමය අවුරුද්දකට රු. 1,020—15×120—රු. 2,820කි.

3. **වයස සීමාවන්.**—1958 දෙසැම්බර් මස 6 වැනි දිනට වයස අවුරුදු 17ට අඩු හෝ, අවුරුදු 25ට වැඩි හෝ නොවිය යුතුය. (මෙම වයස සීමාවන් දැනට රජයේ සේවයේ සිටින්නා වූ අයදුම්කරුවන්ට බලපානු නොලැබේ.)

4. **සේවයේ කොන්දේසි.**—තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් දිය යුතුය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ද, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, තෘණ විද්‍යාව, ජීව විද්‍යාව, කායික විද්‍යාව හා සවසත්තාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ උසස් විභාගයකින් හෝ සාමර්ථ්‍යය ලබා ඇති බවට සාක්ෂි තිබිය යුතුය.

6. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තෝරා ගන්නා අයදුම්කරුවන් අවුරුදු තුනක් පරිවාසනයට යටත් වෙනවාත් හැර දිවසිනේ ඕනෑම පළාතක සේවයේ යෙදෙන්ට සිදුවෙනවා පමණක් නොව රජය මගින් අනුමත කරනු ලබන ඇප මුදලක් තබන්නටද සිදු වෙනවා ඇත.

7. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත් හා පහත සඳහන් සහතිකයන්ගේ පිටපත් එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපනය සම්බන්ධයෙන් ලබා ඇති උසස්ම සහතිකය,

(iii) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික තුනක්.

8. පහත ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කර ගන්නා ලද අයදුම් පත්‍ර පේරාදෙනියේ කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාට 1958 දෙසැම්බර් මස 6 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. දෙපාර්තමේන්තුවේ අන් නිලධාරියෙකුට හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ පුද්ගලික නමට අයදුම් පත් නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි භාගයෙහි II වැනි ඡේදයෙහි මුලින්ම දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන සාමාන්‍ය කොන්දේසි ද බලන්න.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
1958 නොවැම්බර් 4.

### ඉහත සඳහන් කළ ආකෘති පත්‍රය

#### රසායනාගාර සහායක තනතුර

(1) (අ) සම්පූර්ණ නම :————
(ආ) ලිපිනය :————.

(2) උපන් දිනය හා ස්ථානය (උප්පැන්නය ලියාපදිංචි කළ බවට සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

(3) ජාතිය :————.

(4) ලබා ඇති උසස්ම අධ්‍යාපනය (සාමර්ථ්‍යය ලබා ඇති විෂයයන්ගේ නම් ද සඳහන් කළ යුතුය) :————.

(5) පළපුරුද්ද, අභ්‍යාසය ආදි වෙනත් විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(6) වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය ඒවා බවට සහතික කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හේතුවෙන බවද මම හොඳ හැටි දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පේරාදෙනියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂට.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### උප පරීක්ෂක තනතුරක් (තාවකාලික)

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ තාවකාලික උප පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1958 නොවැම්බර් 30 වැනි දිනට හෝ ඊට මත්තෙන් මට ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 1,860න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 120 බැගින් වැඩිවී රුපියල් 3,780 දක්වා නගී. රුපියල් 2,820න් ඉහළට නැගීමට පෙර කාර්‍ය්‍ය සූරතා කඩුලුවෙන් පැනිය යුතුයි. ගෙවල් කුලී දීමනා ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන දීමනා ආණ්ඩුවේ දීමනා මුදල් ප්‍රමාණයට ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම් කරුවන්ම—

(අ) 1958 නොවැම්බර් 30 වැනි දිනට තමාගේ වයස අවුරුදු 20 ට නොඅඩු බවටත් අවුරුදු 30 ට නොවැඩි බවටත්,

(ආ) තමා විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත්, හා

(ඉ) 1. ලංකා කාර්මික විද්‍යාලයේ සිවිල් ඉංජිනේරුවන් සඳහා පවත්වන අවුරුදු හතරකට නොඅඩු පාඩම් මාලාවක් සාර්ථක අන්දමින් අවසන් කර ඇති, හෝ

2. මිනින්දෝරුවෙකු සහ මට්ටම්කරුවකු ලෙස කටයුතු කිරීමට මිනින්දෝරු ජනරාල් තුමාගේ අවසර ලද්දකු හා අවුරුදු දෙකක ගොඩනැගිලි පිළිබඳ පළපුරුද්ද ඇත්තකු, හෝ

3. අවුරුදු පහක් සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආධුනික සේවයක් අවසන් කර ඇති හෝ අඩු වශයෙන් අවුරුදු පහක ආධුනික සේවයක් සහිත අත්දුටු පළපුරුද්දක් ඇති සහ මේ දෙකටම ඇතුළුව ගොඩනැගිලි හෝ විශාල ගොඩනැගීම් සහ මට්ටම් කිරීම සහ මැනීම් පිළිබඳව අනිශ්චිත විධි ක්‍රම දැනීමක් සහ අත්දුටු පළපුරුද්දක් ඇත්තකු, හෝ

4. අඩු වශයෙන් ඉංග්‍රිසි කණිෂ්ඨ විභාගයෙන් සමත් අවුරුදු හතකට නොඅඩු කාලයක පාරවල් සෑදීම සහ ගොඩනැගිලි තැනීම සම්බන්ධයෙන් අත්දුටු පළපුරුද්දක් ඇති මැනීම් සහ මට්ටම් කිරීමෙහි මනා දැනීමක් ඇත්තකු, බවටත්,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අවශ්‍ය සුදුසුකම් නැති අයදුම් කරුවන් ඉල්ලුම් කිරීම අනවශ්‍යයයි)

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තනතුර තාවකාලිකය, විශ්‍රාම වැටුප් රහිතය. මසක් කල්දීමක් ඇතුව සේවය අවසන් කළ හැකිය. අර්ථ සාධක අරමුදලට අයත් මුදල් ගෙවනු ලැබේ.

5. යම් අපේක්ෂකයෙකුගේ තේරීම සම්බන්ධයෙන් කොයි යම් විධියකින් වුවත් සිත නම්වා ගැනීමක් හෝ බලපැවැත්වීමක් හෝ පිණිස උත්සාහයක් කළහොත්, එයින්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේය.

6. අයදුම් කරුවන් තම ඉල්ලුම් පත්‍රවල පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (ස. ලෙ. බවුතිස්ම සහතික පත්‍ර උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාර ගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන හෝ වෘත්තිය සහතික පත්‍රය.

(ඇ) තම සුදුසුකම්, චරිතය මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක්. (රාජ්‍ය සේවයෙහි සිටින අයදුම් කරුවන්ට මේ උප වගන්තිය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ.)

7. සියලුම ඉල්ලුම් පත්‍ර සහ මේ සම්බන්ධ සියලුම ලියුම් ගනුදෙනු, ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තැනට එවිය යුතුයි. මේ හැර ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලික වශයෙන් නොඑවිය යුතුයි.

8. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරු වලට කරන පත් කිරීම් වලට අදාලවූද පොදු කොන්දේසි බලන ලෙස මතක් කරමි.

9. එවන සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීම නවත්වා 10 දිනක් ඇතුළත එබඳු දැන්වීමක් යම් අයදුම් කරුවකුට නොලැබුණහොත් ඒ බව ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තැනට වහාම දැන්විය යුතුයි. මෙසේ නොකළහොත් ඔහු ගැන සලකා බැලීමට ඇති යුතුකම නැති වේ.

ආර්. ඇල්. ආර්නෝල්ඩා.
ජාතික නිවාස කොමසාරිස් තැන.

1958, නොවැම්බර් 11 දින,
කොළඹ, ලංකා බැංකු ගොඩනැගිල්ල,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව.

### ආකෘති පත්‍රයයි

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### තාවකාලික උප පරීක්ෂක තනතුරක්

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලිවිය යුතුයි.) :—
   (අ) පෙලපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. (අ) 1958 නොවැම්බර් 30 වැනි දිනට නියම වයස :————.
   (ආ) උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි. එය ආපසු එවනු නොලැබේ) :————.

4. ජාතිය සහ කෙසේ ලැබුනේ ද යන බව :————.

5. ඉල්ලුම් කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.

6. උපන් ස්ථානය.
   (අ) ඉල්ලුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියාගේ :————.
   (ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ සීයාගේ :————.
   (ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තනුවන්ගේ : ————.

7. විවාහක, අවිවාහක හෝ වැන්දඹු බව :————.
   (විවාහක නම් විවාහවූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න) :————.

8. අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සාමර්ථ්‍යය ලත් විභාගය (දිනය සහිතව) :————.
   (අ) ඉංග්‍රීසි :————.
   (ආ) සිංහල/දෙමළ :————.

9. කාර්මික සුදුසුකම්⁄සහ සාමර්ථ්‍යය ලත් විභාග (දිනය සහිතව) : ————.

10. ඉහත සඳහන් 3 වන ඡේදයේ (ඉ) කොටසේ කුමන වගන්තියට අයත් සුදුසුකම් වලින් ඔබ මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුස්සකුවී දැයි සඳහන් කරන්න :————.

11. කාර්මික පලපුරුදු :————.

12. පාසලෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් :————.

13. වෙනත් විශෙෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ තොරතුරු : ————.

14. ඔබ ණය ගැති කමින් නිදහස් ද? නොඑසේ නම් කෙතරම් ණය ගැතිද? :————.

15. වෙනත් විස්තර :————.

මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති කරුණු සත්‍යවූ සහ නිවැරදි බවට සහතික කරමි. තවද මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි සහගත යයි කලින් දැන ගතහොත් එය මේ තනතුර සඳහා නුසුදුසුකමක් හැටියටත් පත් වූවාට පසු දැන ගතහොත් කිසිම වන්දි ආදියක් නැතිව සේවයෙන් නෙරපා හැරීමේ දඬුවමටත් යටත් වන බව මම හොඳින් දනිමි.

දිනය :————.

————

ඉල්ලුම්කරුගේ අත්සන.

**සටහන් :—**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය : 1958 නොවැම්බර් 30 වන දින.

**ඉල්ලුම් පත :—**

ජාතික නිවාස කොමසාරිස්,
ලංකා බැංකු ගොඩනැගිල්ල,
කොළඹ 1.

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ග්‍රාමීය කර්මාන්ත අධිකාරී තනතුර

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය කර්මාන්ත පරිපාලක තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවා සිටිනු ලැබේ. මෙම තනතුරු දෙකින් එක් තනතුරක් වැඩ බලන ග්‍රාමීය කර්මාන්ත අධිකාරී තනතුරකි. මෙම තනතුරු සඳහා මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාරයට සකස් විය යුතුවූ ඉල්ලුම් පත්‍ර 1958.12.16 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන්ට සැළැස්විය යුතු වන්නේය.

2. වැටුප් අමතර දීමනා හා සේවා කොන්දේසි :—

(i) මෙම තනතුරු සඳහා වාර්ෂික වැටුප රුපියල් : 1,860—16×120—රුපියල් : 3,780 කි. රුපියල් 2,820ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමක් වෙයි. තෝරාගනු ලැබූ අයදුම් කරුවන් විසින් මෙම කාර්යක්ෂමතා කඩඉමට ප්‍රථම භාෂා පිළිබඳ පරීක්ෂණයකින් සාමර්ථ්‍ය ලැබීම අවශ්‍ය වන්නේය. තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් සතුව මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් හෝ තිබේ නම්, ඒ සඳහා පරිවර්තිත ගමන් ගාස්තුවක් ඔවුන්ට ගෙවනු ලැබේ.

3. සේවයට ඇතුළත් කරගැනීම පිළිබඳ කොන්දේසි :—

(i) වැඩ බැලීමේ තනතුර රජයේ සේවය යටතේ ස්ථාවර තනතුරක් බවට පත්කිරීමේලා ඉල්ලා සිටීමට කිසිසේත් අයිතිවාසිකමක් නැති අතර ස්වාමි සේවක උභය පක්ෂය විසින්ම මසක් කල්දීමෙන් සේවයෙන් නතර කිරීමට හෝ නතර වීමට හැකිවන්නේය.

(ii) නවක ප්‍රවේශක නිලධාරීන් විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමේදී හා විශෙෂයෙන්ම 1956යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදීද දැනට පනවා ඇති නීති රීති වලට මෙන්ම මින් මතුවට පනවනු ලබන නීති රීති වලටද අනුකූලව ක්‍රියා කළයුතුය.

4. සුදුසුකම් :—සෑම අයදුම්කරුවකු විසින්ම—

(අ) 1958-12-16 වැනි දිනට වයස අවුරුදු 40කට වැඩි නොවන බවටද,

(ආ) හොඳ කල්ක්‍රියාවෙන් හා යහපත් ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවටද, හා

(ඇ) සිවිල් ඉංජිනේරු ආධුනික සේවයේ පස් අවුරුදු කාල සීමාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබෙන බවට හා උප පරීක්ෂක ශ්‍රේණියට උසස්වීම සඳහා සුදුසුවූ රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයෙන් සාමර්ථ්‍යය ලබා ගෙන තිබෙන බවටද හෝ

(ඈ) කෙටුම්පත් කරුවකු වශයෙන් හෝ ඕවර්සියර්වරයකු වශයෙන් හෝ පස් වර්ෂයකට වැඩිවූ ප්‍රායෝගික කෘතහස්තතාවක් තිබෙන බවට හා උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම පිණිස සුදුසුවන රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයෙන් සාමර්ථ්‍යය ලබා තිබෙන බවටද,

(ඉ) කාර්මික විද්‍යාලයක අවුරුදු හතරකට අඩුනොවූ කාල පරිච්ඡේදයක සිවිල් ඉංජිනේරු ශිල්පීය අධ්‍යාපනයක් සම්පූර්ණකර තිබෙන බවටද, හෝ

(ඊ) උප පරීක්ෂක ශ්‍රේණියට පත්වීම සඳහාවූ රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයෙන් සාමර්ථ්‍යය ලබා ජල සම්පාදන යෝජනා ක්‍රම පිළිබඳ ද්වි වාර්ෂික කෘතහස්තතාවක් තිබෙන බවටද, හෝ

(උ) පහත සඳහන් විෂයයන් ඇතුළත් ලංකා කාර්මික විද්‍යාලයේ I හා II මානක ශිල්පය සහිත අනුමත පාඨමාලාවක් එනම් :—

(i) I හා II ගොඩනැගිලි සෑදීම හෝ

(ii) I හා II සනීපාරක්ෂක ඉංජිනේරු ශිල්පයද සම්පූර්ණ කොට එයට අමතර වශයෙන් ඉංජිනේරු නිර්මාණක කටයුතු පිළිබඳ ද්විවාර්ෂික කෘතහස්තතාවයක්ද තිබෙන බවටද හෝ

(ඌ) ප්‍රධාන භූමාණක තුමාගෙන් මාණක හා සමතල ශිල්ප බල පත්‍රය ලබාගෙන ඇති බවට හා ජල සම්පාදන කටයුතු හා ගොඩනැගිලි තැනීමේ කටයුතු යන මේ ආදී නිර්මාණක වැඩ කටයුතු පිළිබඳ ද්විවාර්ෂික කෘතහස්තතාවක් ලබා තිබෙන බවටද, ,හෝ

(එ) සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පයේ ආධුනික සේවයේ අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කර තිබෙන බවට හෝ මුළු මනින්ම අවුරුදු පහකට නොඅඩු ආධුනික සේවයෙක යෙදී සිටි බවට හා ප්‍රායෝගික කෘතහස්ත තාවයක් ලබා ඇති බවට හා එම දෙකටම අමතර වශයෙන් ගොඩනැගිලි හෝ විශාල ගොඩනැගිලි හා මාණක හා සමතල ශිල්පය පිළිබඳ න්‍යායිකඥානය හා ප්‍රායෝගික කෘතහස්තතාවය ලබා තිබෙන බවටද හෝ ;

(ඒ) යටත් පිරිසෙයින් කණිෂ්ඨ විභාගයෙන් සාමර්ත්‍යය ලබා තිබෙන බවට හා පාරවල් හා ගොඩනැගිලි වැඩ පිළිබඳ හත් වර්ෂයක ප්‍රායෝගික කෘතහස්තතාවක් ලබා තිබෙන බවටද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වන්නේය.

(5) අයදුම් කරුවන් විසින් :—

(අ) ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රයද,

(ආ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර තිබේනම්, ඒවාද,

(ඇ) උප්පැන්න සහතික පත්‍රයද, හා

(ඇ) ස්වකීය අධ්‍යාපන සුදුසුකම්, කල්ක්‍රියාව හා මෙම තනතුරට පත් කිරීම පිණිස ඇති යෝග්‍යතාවයද පිළිබඳව ළඟදී ලබා ගත් සහතික තුනක් (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම උප වගන්තිය යටතේ වූ සහතික පත්‍ර ඉදිරිපත් කර සිටීම අවශ්‍ය නැත්තේ ය.) ඉදිරිපත් කර සිටිය යුතුය (මේ සහතික පත්‍ර ඉදිරිපත් කර සිටීමේ දී ඒවායේ පිටපත් පමණක් එවිය යුතු බව සැළකුව මැනවි).

සැ. යු.—මෙම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර හා චරිත සහතික ආපසු එවනු නොලැබේ).

6. අවශ්‍ය බව කල්පනා කරනු ලැබෙතොත් අයදුම්කරුවන් විසින් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිනු ලැබීම අවශ්‍ය වන්නේ ය.

7. මේ සම්බන්ධයෙන් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පළවූ රාජ්‍ය සේවායේ තනතුරු වලට පත් කිරීම පිළිබඳ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි මෙයින් අවධානය යොමු කරවනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන පළාත් පාලන කොමසාරිස් තැන.

1958 නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ පළාත් පාලන කායභාලයේදීය.

### ඉහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය

#### ග්‍රාමීය කර්මාන්ත අධිකාරී තනතුර සඳහාවූ ඉල්ලුම් පත්‍රයයි

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. 1958-12-16 වැනි දින නියම වයස :—
   අවුරුදු.........මාස.........දින.........යි.
5. අයැදුම්කරුවාගේ පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.
6. ජාතිය :————.
7. උපන් ස්ථානය :————.
   (අ) අයැදුම්කරුවාගේ :————.
   (ආ) ඔහුගේ පියාගේ :————.
   (ඇ) ඔහුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඇ) ඔහුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
8. අධ්‍යාපන සුදුසුකම් :—
9. කාර්මික සුදුසුකම් :—
10. පාසැලින් අස්වූද සිටි යෙදුණු රක්ෂාවල් :————.
11. දැනට කරන රක්ෂාව හා ලබන වැටුප :————.
12. මෙම තනතුර සඳහා සුදුසුකම් කියා සිටින්නේ දැන්වීමේ 4 වැනි ඡේදයේ කවර වගන්තිය යටතේ ද යනවග :————.
13. පහත සඳහන් විෂයයන් පිළිබඳව ලබා තිබෙන කෘතහස්තතාවය පිළිබඳ විස්තර :—
    මාණික හා සමතල ශිල්පය :————.
    ගොඩනැගිලි තැනීම :————.
    පාරවල් සෑදීම :————.
14. පහත සඳහන් භාෂාවන් පිළිබඳ ලබා තිබෙන දැනුම :—
    (අ) සිංහල :————.
    (ආ) දෙමළ :————.
15. වෙනත් යම් යම් විශෙෂ සුදුසුකම් ඇතොත්, ඒවා පිළිබඳ විස්තර :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන්ට යෙදුණ විස්තර සත්‍ය බවටත් නිවැරදි බවත් මම මෙයින් සහතික කර සිටිමි. මෙහි සඳහන් කිසියම් විස්තරයක් හෝ තොරතුරක් අසත්‍ය බව හෝ නිවැරදි බව හෝ දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන්ම මා එම තනතුරට තෝරාගනු ලැබීමට ප්‍රථම ඊට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුණි නම්, කිසියම් වන්දියක් නොගෙවාම මා රාජ්‍ය කායභියෙන් පහකරනු ලැබීමටත් අවකාශ තිබෙන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

### ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 2 වන ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඕවර්සියර් තනතුරු 20ක් සඳහා ඉල්ලුම් පත්‍ර පහත සඳහන් පෝරමයේ 1958 නොවැම්බර් මස 26 වෙනි දින දවල් 12ට පෙර ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවශ්‍ය වූ වීටෙක ස්ථාන මාරු කිරීමේ කොන්දේසියට යටත්ව මෙම පත්වීම් දෙනු ලැබේ. තනතුරු සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් වැන්දඹු සහ අනාථ විශ්‍රාම වැටුප් අරමුදලට තම කොටස ප්‍රදානය කළ යුතුයි.

3. මෙම තනතුරේ වාර්ෂික පඩිය රුපියල් 750න් පටන් ගෙන, වසට රුපියල් 42 බැගින් 8 වසක් වැඩිවී වෂියකට රුපියල් 1,086 දක්වා නගී.

4. අයදුම්කරුවෝ 1958 නොවැම්බර් මස 21 වෙනි දිනට වයස අවුරුදු 24 සහ 40 අතරවූ ලාංකිකයෝ විය යුතුයි. රජයේ දෙපාර්තමේන්තුවල සේවකයන්ට මේ වයස සීමාව අවශ්‍ය නැත.

5. පහත සඳහන් සුදුසුකම් අයදුම්කරුවන් සතුවිය යුතුයි :—

(අ) පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය සිංහල (ඉංග්‍රීසි දැනුමත් ඇතිව), හෝ

(ආ) පාඨශාලා කණිෂ්ඨ ඉංග්‍රීසි සහතික පත්‍රය (සිංහලත් විෂයයක් වශයෙන්), සහ

(ඇ) කෘෂිකර්ම පාඨශාලා පුහුණුවක් ලත් බවට සහතිකයක් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් කෙනෙකු ලෙස දෙවසක පළපුරුද්දක් ඇති බවට සහතිකයක්.

සැළකිය යුතුයි :—

ඉඩම් කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවෙහි තාවකාලික ඕවර්සියර් කෙනෙකු වශයෙන් 5 අවුරුද්දක පළපුරුද්දක් හා එම කාලය තුළ සතුටුදායක ලෙස කරන ලද රාජකාරිය සහ මනා හැසිරීමකින් යුත් සිංහල විෂයය සමඟ ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණයෙන් සමත්වූවෝ මෙම පත්වීම ලැබීමට සුදුස්සෝ ය.

6. පත්වීම් තුන් අවුරුදු කාල පරිච්ඡේදයක පරීක්ෂාවට යටත්ව දෙනු ලැබේ. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් ලංකාවේ ඕනෑම තැනක රාජකාරිය කිරීමට පත් කරනු ඇත. ඔවුන් විසින් තම රාජකාරි කටයුතු සඳහා අනුමත කරනලද වාහනයක් තබා ගැනීම අවශ්‍ය වේ. ආණ්ඩුවේ මුදල් ව්‍යවස්ථාවනට අනුකූලව ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

7. යම් වටිනාකමකින් යුත් ඇපයක් තබන ලෙස ආණ්ඩුව විසින් නියම කලහොත් ආණ්ඩුව විසින් අනුමත කළ අන්දමට එම ඇපය බැඳීමට තෝරාගත් අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතුයි.

8. සෑම ඉල්ලුම් පත්‍රයකම පහත සඳහන් සම්පූර්ණ විස්තර සඳහන් විය යුතුයි :—

(අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය ;

(ආ) උපන් දිනය සහ වයස ;

(ඇ) (1) අධ්‍යාපනික සුදුසුකම් : (සහතික පත්‍රයේ පිටපතක් අමුනා එවිය යුතුයි), (2) කෘෂිකාර්මික පුහුණුවෙන් සාමාර්ථය ලැබූ මධ්‍යස්ථානය සහ පුහුණුව ලැබූ කාල සීමාව. (සහතික පත්‍රයේ පිටපතක් අමුනා එවිය යුතු) ;

(ඈ) කෘෂිකාර්මික පළපුරුද්ද ;

(ඉ) දැනට කරන රක්ෂාව සහ වැටුප් ප්‍රමාණය ;

තවද සෑම ඉල්ලුම්කරුවෙක්ම සිය ඉල්ලුම් පත්‍රයට අමුනා මෑතක දී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත්‍ර දෙකක පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

9. නොවැම්බර් මස 26 වෙනි දින දවල් 12ට පෙර ලැබෙන සේ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුරාධපුර කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත තැපැල් කළ යුතුයි.

10. සහතික පත්‍රවල පිටපත් මිස මුල් පිටපත් ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු නොවේ. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නො ලැබේ.

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ්ට කිරීමක් නොමැතිව රජයේ සේවකයන්ගෙන් මේ සඳහා ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

ඩී. සී. ඇල්. අමරසිංහ,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා
වෙනුවට.

1958 නොවැම්බර් මස 7 වෙනි දින,
අනුරාධපුර දිසාපති කායභාලයේදීය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/3/5 (ජී).

වෂී 1958 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 11,564 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ඔක්තෝබර් මස 21 වැනි දින දරන නිවේදනය හා සම්බන්ධයි.

වෂී 1958 පෙබරවාරි මස පවත්වනු ලැබූ මධ්‍ය ලිපිකරු විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපෙක්‍ෂකයන් ද සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියට පත් කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| අප්පුහාමි, ඩබ්ලිව්. එම්. ... | දොරකුඹුර, පදියතලාව. |
| ආදිරිස්හාමි, ඩී. ජී. ... | අළුවඹුවිට, අතුරලිය, අකුරැස්ස. |
| ආනන්දවිජය, පී. ඩබ්ලිව්. | " විජය නිවස ", මොරවක |
| කරුණාරත්න, ඊ. එම්. ... | පස්බාගේ කෝරළේ ගම්කායමී සහ කායමීලය, රඹුක්පිටිය, නාවලපිටිය. |
| කරුණාරත්න, පී. ඊ. ... | 85/5, කුඹල්වැල්ල පාර, බටගන්විල, ගාල්ල. |
| කුමනන්, වී. ... | වරුතලෙයි විලන්, තෙල්ලිප්පලෙයි. |
| කුලසේගරම්, එස්. ... | 226, ත්‍රිකුණාමල වීදිය, මහනුවර. |
| ගුණසේකර අප්පුහාමි, එස්. ඒ. | රජයේ කණිටු පාසැල, නිකවැරටිය. |
| චන්ද්‍රපාල, ජේ. එම්. ... | දෝව, බණ්ඩාරවෙල. |
| ජයසිංහ, ආර්. ඒ. එන්. ... | හලාවත/පුලියන්කාර පාසැල, මුගුණු වටවන, හලාවත. |
| ජයසිංහ, එම්. කේ. ජේ. ... | හ/වරාපිටිය රජයේ පාසැල, වරාපිටිය, වලස්මුල්ල. |
| තංගරාජා, එස්. ... | " ලෙච්චුමි වාස ", උඩුවිල්-දකුණ, චුන්නාකම්. |
| තිලකරත්න, පී. ... | 226, කඩවල පාර, පන්නිපිටිය. |
| තුලසිගාමනි, කේ. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කායමීලය, නැදුන්කර්නි. |
| දුඹුකොළ, එච්. එම්. ඒ. ... | දුඹුකොළ, උකුවෙල. |
| නාගරාජා, එස්. ... | " වේලාවෙයි ", අලවෙඩ්ඩි-උතුර, අලවෙඩ්ඩි. |
| පද්මනාදන්, එස්. ... | 364, ගාළු පාර, කොල්ලුපිටිය. කොළඹ 3. |
| පද්මනාදන්, වී. ... | සන්ගත්තානෙයි, චාවකච්චේරිය. |
| පරමලිංගම්, කේ. ... | 36/2, පෙරේරා පටුමග, වැල්ලවත්ත, කොළඹ 6. |
| පියදාස, එන්. පී. ... | " ගුරු නිවස ", අපරැක්ක, දියගහ. |
| පියසේන, කේ. ඒ. ඩී. ... | 582, දරණාගම, දෙල්ගොඩ. |
| පියසේන, කේ. පී. එල්. එස්. | හ/ගැටමාන්න රජයේ පිරිමි පාසැල, බෙලිඅත්ත. |
| පුංචිතිලමෙ, ඒ. එම්. ... | " වෙළගෙදර ", වදුව, වදුකඩ. |
| පෙරේරා, කේ. ඩී. ... | රජයේ මුස්ලිම් පාසැල, ගුරුතලාව. |
| පොන්නම්පලම්, එන්. ... | ශාන්ත ලෝරන්ස්ගේ පල්ලිය අසල, ඩෙල්fප්ට්-බටහිර, ඩෙල්fප්ට්. |
| ප්‍රනාන්දු, පී. එෆ්ජ්. ... | 37/44, වෝල්ස් පටුමග, කොළඹ 15. |
| බන්දුසීල, එන්. එච්. ... | බෝගහවත්ත, අම්බලන්ගොඩ. |
| මනම්පේරි, අයි. ... | වරකාපිටිය මිශ්‍ර පාසැල, දෙනිපිටිය. |
| මැන්ඩිස්, පී. පී. ... | ග/නෙටොල්පිටිය රජයේ පාසැල, නෙටොල්පිටිය. |
| රණසිංහ, එස්. ... | හ/බැරගම රජයේ මිශ්‍ර පාසැල, පහළ-බෙරගම, අම්බලන්තොට. |
| රත්නපාල, බී. එම්. ... | ආර්/කරන්ගොඩ පාසැල, කරන්ගොඩ. |
| රුද්‍රිගු, ඩී. එච්. එෆ්ජ්. ඊ. ... | දංකොටුව. |
| රොමියෙල්, පී. ඒ. ... | ගිඹුටුගේන, හොරණ. |
| ලැම්බර්ට්, එල්. වී. ... | වන්කලේ. |
| විල්බට්, කේ. ඒ. ... | රජයේ අභ්‍යාස විද්‍යාලය, කටුකුරුන්ද, කළුතර. |
| සබ්රි, එස්. එම්. ... | පාසැල පාර, පරගහදෙනිය, වැඋඩ. |
| සමරකෝන්, එස්. එම්. එන්. ... | " ජී " පන්තිය, 137, අභ්‍යාස විද්‍යාලය, බලපිටිය. |
| සමරතුංග, යූ. ඒ. ඩී. සී. ... | උඩ්වෙල, අගලවත්ත. |
| සමරසිංහ, එස්. එම්. ජී. ... | පල්ලියපිටිය, දූනාගහ. |
| සයිමන් සිංඤෝ, බී. ඒ. ... | මාදම්පෙ පාර, කැන්නන්තුඩාව, ගල්තොට. |
| සාදි බන්ඩා, සී. ආර්. ඒ. අම්. ... | අටුගොඩ, අඹන්පිටිය. |
| සින්නයියා, එස්. ... | වරනි-උතුර, වරනි. |
| සිවලිංගම්, එන්. ... | කුමුලමුනෙයි, මුල්ලියවලෙයි. |
| සිංගප්පුලියා, එල්. එච්. ... | කුරීකොටුව, කොබෙයිගනේ. |
| සුගතදාස, ආර්. ඒ. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කායමීලය, හොරණ. |
| සෙල්වදාස්, ඊ. ... | " සෙල්වස්ථාන් ", චාවකච්චේරිය. |
| සෝමපාල, ඒ. ජී. ... | කහව, තෙල්වත්ත. |

2. මේ අපේක්‍ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. නමුත් ඇබෑර්තු ඇතිවන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර වෛද්‍ය පරීක්‍ෂණයකට සහ සාමාන්‍ය ලිපිකරු සේවයේ කොන්දේසිවලට යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදීය.

---

## ලංකාණ්ඩුවේ විභාග දෙපාර්තමේන්තුව

### සිංහල භාෂාමය වාණිජ සහතික පත්‍ර විභාගය—1959

ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍ර

1. **දිනය හා විභාග මධ්‍යස්ථාන.**—(අ) මේ විභාගය 1959 අගෝස්තු මස 20 වැනි දින පටන් ගෙන, පහත සඳහන් මධ්‍යස්ථානවල පවත් වනු ලැබේ. එනම් :—

කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, රත්නපුරය, යාපනය, බදුල්ල, කුරුණෑගල, අනුරාධපුරය, මඩකලපුව, මීගමුව හා කළුතර.

(ලඝු ලේඛනය පිළිබඳ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ පමණකි. එය පවත්වනු ලබන දිනය හා ස්ථානයන් අයදුම්කරුවන්ට පසුව දැනුම් දෙනු ලැබේ.)

(ආ) අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඇතුළත් වී නැති කවර මධ්‍යස්ථානයක් වුවද අවලංගු කරනු ලැබේ.

2. **සුදුසුකම්.**—හැම අයදුම්කරුවකුම පහත සඳහන් සහතික පත්‍ර වලින් එකක්වත් ලබා සිටින අය විය යුතුය :—

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය (සිංහල භාෂාවෙන් සාමර්ථ්‍යය ඇතුළු) ;

(ii) එක විටම (එක වරම)—

(අ) සිංහල භාෂාවෙන් ;

(ආ) අංකං ගණිතය, වාණිජ අංක ගණිතය, ගණිතය යන මේ විෂයයන්ගෙන් එක් විෂයයකින් ; හා

(ඉ) තවත් විෂයයන් තුනකින් සමර්ථවීමෙන් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය).

**සැලකිය යුතුයි.**—මේ පරීක්ෂණයට ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාවේදී සෑම අයදුම්කරුවකුම අවශ්‍ය සහතික පත්‍ර ලැබීමට සුදුසු වන සේ නියමිත විභාගවලින් සමර්ථව සිටිය යුතුයි. පෙනී සිටි විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටීම මේ පරීක්ෂණයට ඉල්ලුම් පත්‍ර එවීමට සුදුසුකමක් නොවේ. එවැනි අය එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. **ඉල්ලුම් පත්‍ර.**—(i) විභාගයට ඇතුළත්වීම සඳහා මෙම කායමීල යෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රවල ලියන ලද ඉල්ලුම් පත්‍ර, අයදුම්කරුවන් විසින්, 1959 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට කලින්, කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් තැන වෙත ලැබෙන සේ **රෙජිස්ටර් තැපැලෙන්** එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරවල වම් පැත්තේ මුදුනේ විභාගයේ නමත් තමන් ඉල්ලුම් කරන මධ්‍යස්ථානයේ නමත් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු බැව් දන්වා එවනු නොලැබේ.

(ii) විභාගය සඳහා ව්‍යවස්ථා දැන් මෙම කායමීලයෙන් ලබාගත හැක. ඉල්ලුම් පත්‍ර ලබාගත හැක්කේ 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට 18 වැනි දින දක්වායි. ව්‍යවස්ථා හෝ ඉල්ලුම් පත්‍ර හෝ තැපැලෙන් ඉල්වා එව්මේදී ඒ සමග තමන්ගේ ලිපිනය සඳහන් දිග කවරයක් (මුද්දර නොමැතිව) එවීම ව්‍යවස්ථා හෝ ඉල්ලුම් පත්‍රය හෝ අපේක්ෂකයා වෙත නිවැරදිව ද අප්‍රමාදව ද යැවීමට උදව්වක් වන්නේ ය. ආකෘති පත්‍ර හා ව්‍යවස්ථා තොග වශයෙන් ලබා ගත නො හැකිය. එක අයකුට දෙනු ලබන්නේ එක ව්‍යවස්ථා පිටපතකි. එක ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රයකි.

(iii) විභාගයට ඇතුළු කර ගැනීම ඊට පෙනී සිටීමට සුදුසුකමක් ලෙස සම්මත නොවේ. සුදුසුකම් නැති කවර හෝ අපේක්ෂකයකුගේ විභාග ප්‍රතිඵල අවලංගු කරනු ලැබේ.

(iv) ප්‍රමාද වී එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. **විභාග ගාස්තු.**—ඒ ඒ විභාග සඳහා පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුයි :—

| | රු. | ශ |
|---|---|---|
| (අ) වාණිජ සහතික පත්‍රය (ගණන් තැබීම) ... | 25 | 0 |
| (ආ) වාණිජ සහතික පත්‍රය (ටයිප් ගැසීම හා ලඝු ලේඛනය ... ... | 25 | 0 |
| (ඉ) වාණිජ අංක ගණිතය හා ගණනාධිකරණය යන විෂයයන් දෙකට පමණක් ... | 10 | 0 |
| (ඊ) ටයිප් ගැසීම හා ලඝු ලේඛනය යන විෂයයන් දෙකට පමණක් ... ... | 10 | 0 |

5. **විභාගයෙන් අස්වීම.**—විභාගයෙන් ඉල්ලා අස්වීමට අවසර දෙනු නොලැබේ. විභාගයට ඇතුළත්වීම පිණිස ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාගයට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නො තිබීම නිසා ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට යෙදුණු අයදුම්කරුවකුට හෝ ඉල්ලුම් පත්‍රය භාරගන්නා අන්තිම දිනට පසුව සවකීය ඉල්ලුම් පත්‍රය එවන අයදුම්කරුවකුට හෝ තමන් ගෙවූ විභාග ගාස්තු කිසිවක් ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත. එහෙත් විභාගයේ එක විෂයයකටවත් පෙනී නොසිට යම්කිසි අයදුම් කරුවකු මියගියහොත් ඔහු විසින් ගෙවා තිබුණු විභාග ගාස්තු එය ලැබිය යුත්තන්ට සම්පූර්ණයෙන් ආපසු ගෙවනු ලැබේ.

6. **හැඳින්වීමේ පත්‍ර.**—අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයයට පෙනී සිටින විට විභාගශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ හැඳින්වීමක් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card).

(ආ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්දවූද වලංගුව පවත්නාවූද "පාස්පෝර්ට්" (Passport) බලපත්‍රයක්.

(ඉ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරන ලද්දවූද තම ඡායාරූපය දරන්නාවූද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්.

**සැලකිය යුතුයි.**—තමන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය සමග ඉහත සඳහන් වූ ලියවිලිවලින් එකක්වත් ඉදිරිපත් නො කරන විභාගාපේක්ෂකයෝ විභාගයට ඇතුළු කර ගනු නොලැබෙත්.

7. **ප්‍රවේශ පත්‍ර.**—යම් හෙයකින් අයදුම්කරුවකුට විභාගය පටන් ගන්නා දිනයට දවස් 7කටවත් කලින් ප්‍රවේශ පත්‍රයක් නොලැබුණ හොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් තැන වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය "Exams—Colombo") ප්‍රවේශ පත්‍රය නොලැබුණු බව නොපමාවම දන්වා එවිය යුතුයි. එසේ දන්වා එවීමේදී පහත සඳහන් විස්තරද සඳහන් කළ යුතුයි :—

(i) විභාගයේ නම.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම.

(iii) සම්පූර්ණ ලිපිනය.

(iv) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය.

(v) ඉල්ලුම් පත්‍රය එවූ දිනය, එම රෙජිස්ටර් කළ තැපැල්පළ හා රෙජිස්ටර් අංකය.

8. **විභාග පරිපාටිය.**—**පහත දැක්වෙන සහතික පත්‍ර දෙකම කිසිම අයදුම්කරුවකුට එකවර ලබා ගත නොහැකිය. හැම අයදුම්කරුවකුටම පෙනී සිටිය හැක්කේ ඉන් එක් සහතික පත්‍රයක් පිළිබඳ විභාගයට පමණි. එහෙත් :—**

(i) **වාණිජ සහතික පත්‍රය (ගණන් තැබීම) ලබාගත් අයකුට ටයිප් ගැසීම හා ලඝු ලේඛනය යන විෂයයන් දෙකටම පසු වාරයකදී පෙනී සිට ඉන් එකවරම සමර්ථවීමෙන් වාණිජ සහතික පත්‍රය (ටයිප් ගැසීම හා ලඝු ලේඛනය) ලබාගත හැක.**

(ii) **වාණිජ සහතික පත්‍රය (ටයිප් ගැසීම හා ලඝු ලේඛනය) ලබාගත් අයකුට, වාණිජ අංක ගණිතය හා ගණනාධිකරණය යන විෂයයන් දෙකට ම පසු වාරයකදී පෙනී සිට ඉන් එකවරටම සමර්ථ වීමෙන්—වාණිජ සහතික පත්‍රය (ගණන් තැබීම) ලබා හැක.**

**වාණිජ සහතික පත්‍රය** (ගණන් තැබීම)

මේ සහතික පත්‍රය ලැබීම සඳහා පහත දැක්වෙන විෂයයන්ගෙන් සමර්ථ විය යුතුයි :—

| | | |
|---|---|---|
| (1) සිංහල භාෂාව | ... ... | පැ 3 යි |
| (2) වාණිජ විද්‍යාව සහ මුදල් | ... ... | පැ 6 යි |
| (3) හස්ත ලේඛනය | ... ... | පැ 2 යි |
| (4) වාණිජ අංක ගණිතය | ... ... | පැ 3 යි |
| (5) ගණනාධිකරණය | ... ... | පැ 3 යි |

**වාණිජ සහතික පත්‍රය** (ටයිප් ගැසීම හා ලඝු ලේඛනය)

මේ සහතික පත්‍රය ලැබීම සඳහා පහත දැක්වෙන විෂයයන්ගෙන් සමර්ථ විය යුතුයි :—

| | | |
|---|---|---|
| (1) සිංහල භාෂාව | ... ... | පැ 3 යි |
| (2) වාණිජ විද්‍යාව සහ මුදල් | ... ... | පැ 6 යි |
| (3) හස්ත ලේඛනය | ... ... | පැ 2 යි |
| (4) ටයිප් ගැසීම | ... ... | පැ 3 යි |
| (5) ලඝු ලේඛනය | | |

**විෂයයන් පිළිබඳ නිර්දේශ**

සහතික පත්‍ර දෙකම සඳහා (1) සිංහල භාෂාව, (2) වාණිජ විද්‍යාව සහ මුදල් හා (3) හස්ත ලේඛනය යන විෂයයන් පිළිබඳ නිර්දේශ හා ප්‍රශ්න පත්‍ර **එකම වේ.**

**සිංහල භාෂාව** (පැ 3යි.)

(i) ව්‍යාකරණානුකූල නිවැරදි සරල සිංහලයෙන් ක්‍රමවත්ව ලිවීමේ දක්ෂතාව මැනීම සඳහා දෙන ලද මාතෘකාවන් ගණනකින් **එකක්** ගැන රචනයක්. (කල්පනය, චින්තනය, තර්කය හා වර්ණනා ශක්තිය ගෙනහැර පෑම සඳහා යොදන මේ අභ්‍යාසයට පැයක් ගත කිරීම සෑහේ.)

(ii) වෙළඳ ලිපියක් හෝ වාර්තාවක් ලිවීම. (මේ අභ්‍යාසයට විනාඩි 30ක් ගත කිරීම සෑහේ.)

(iii) ගද්‍ය ඛණ්ඩයක සාරාංශය ලිවීම. (අර්ථාවබෝධය හා ප්‍රකාශන ශක්තිය මැනීමට යොදන මේ අභ්‍යාසයට විනාඩි 45ක් ගත කිරීම සෑහේ.)

(iv) ගද්‍ය ඛණ්ඩයක අදහස, රසයාදිය පිළිබඳ අභ්‍යාසයක්.

(v) පහත සඳහන් කරුණු සමහරක් හෝ සියල්ලම හෝ පිළිබඳ අභ්‍යාස දෙකක් :—වචන ; වාක්‍යාංශ හා වාක්‍යවල තේරුම් ; කාරක හා අන්‍යොන්‍ය සම්බන්ධය ; අලංකාර ; වාක්‍ය සංයෝජනය ; වියරණ හා රචනා දෙස්.

**වාණිජ විද්‍යාව සහ මුදල්** (වාණිජ භූගෝල විද්‍යාව ඇතුළුව)

**ප්‍රශ්න පත්‍රය** I (පැ 3යි.)

ලෝකය පිළිබඳව ද, විශේෂයෙන් ලංකාව, අග්නිදිග ආසියාව හා පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල වෙළඳාම හා කර්මාන්තය පිළිබඳව ද භූගෝල විද්‍යාව ; (අ) ප්‍රධාන නගර, නැව් තොටු හා නිෂ්පාදන මධ්‍යස්ථාන ; (ආ) ප්‍රධාන නෞකා, ගගන යාත්‍රා හා ධූම රථ මාර්ග ; (ඉ) ප්‍රධාන අමු ද්‍රව්‍ය ; ආහාර ද්‍රව්‍ය හා නිෂ්පාදනය කරන ලද ද්‍රව්‍ය බෙදී ඇති අයුරු පෙන්වන සිතියම් පිළිබඳ මනා දැනුමක් ; ලංකාවත් අන්‍ය රටවලුත් අතර වෙළඳාම් වන ප්‍රධාන වෙළඳ භාණ්ඩ පිළිබඳ දැනුමක්. (අයදුම්කරුවන්ට කටු සිතියම් ඇඳීමේ දක්ෂතාවක් තිබිය යුතුයි.)

**මෙරට වෙළඳාම.**—බඩු විකිණීම, මිලදී ගැනීම හා ඊට අදාළ ලියකිය විලි. මුදල් ගෙවීමේ ක්‍රම :—චෙක්, මනි ඕඩර්, විනිමය බිල් ආදිය. බඩු ගෙන යාම අන්තරායයන්, ආරක්ෂණය (ඉන්ෂුවර්) කළ හැකි අයිති වාසිකම්, සහතික ඔප්පුවේ කොන්දේසි හා පැවරීම් ආදිය පිළිබඳ ගිනි හා අනික් ආරක්ෂණ (ජීවිතාරක්ෂණය නැතිව) සම්බන්ධයෙන් සාමාන්‍ය මූල ධර්ම, කොටස් ගෙවීමෙන් මිලට ගැනීමේ ක්‍රමය, වෙළෙන්ද ළඟ ඇති බඩු පාලනය.

**පිටරට වෙළඳාම.**—වෙළෙන්ද ; බඩු ගෙන්වන්නා ; පිටරටවලට බඩු යවන්නා හා නැවත යවන්නා ; කොමිස් පිට බඩු සපයන්නෝ සහ තොග බ්‍රෝකර්වරු ; බඩු ගෙන යන නියෝජිතවරු ; නැවෙන් හා අහස් යානයෙන් බඩු ගෙන යෑම හා ඊට අයත් ලියවිලි **නැව් කුලී ගිවිසුම ; නැව් භාර පත්‍ර** හා මුහුදු උවදුරු රක්ෂණය පිළිබඳ මූලික කරුණු ; **සාමාන්‍ය හා විශේෂ සාමාන්‍ය ගණන ;** රේගු හා සුරාබදු තීරුව ; බන්ධිත ගුදම් ; ගුදම් බලපත්‍රය, භාරදීමේ ඕඩරය. බඩු සඳහා මුදල් ගෙවන ක්‍රම ; නිෂ්පාදන විනිමයන් ව්‍යාපාර කටයුතු සඳහා ආණ්ඩුව සහභාගි වීම නැතහොත් විදේශීය වෙළඳාමට හා පිටරට වෙළඳ පොළවලට සහාය වීම.

ප්‍රශ්න පත්‍රය II (පැ. 3යි.)

**ව්‍යාපාර ඒකකය හා එහි සංවිධානය.**—ව්‍යාපාරික ආයතනයන්හි සංවිධානය හා ඒවායෙහි සවභාවය, තනි වෙළෙන්ද, හවුල් වෙළඳාම්, පොදු හා පෞද්ගලික වෙළඳ සමාගම්, සමූපකාර සමිති, සංයෝජිතයන් හා **සංගතයෝ**. ව්‍යාපාර වස්තු, කොටස්, ණයකර, උකස්, දීර්ඝ කාල හා කෙටි කාල ණය ගැනීම් ආදිය සඳහා මුදල් හා ප්‍රාග්ධනනය; ව්‍යාපාරික ගණන් හිලව් විස්තර කර දීම, වෙළඳ පිරිවැටුම, වියදම්, දළ ලාභ, පොදු කාර්ය පිරිවැය, ශුඛ ලාභ හා ඒවායෙහි අන්‍යොන්‍ය සම්බන්ධතාව, අයබදු ගැනීම ව්‍යාපාරික මුදල් හා ප්‍රාග්ධනය කෙරෙහි බලපාන හැටි. ව්‍යාපාරය ඇතුළත ලාබ බෙදා හැරීම හා රඳවා ගැනීම. අයවැය ලේඛන හා සංඛ්‍යා ලේඛන තොරතුරු, කම්කරුවන් සේවයට බඳවා ගැනීම හා කම්කරු වැටුප් පිළිබඳ ඇතිවන ප්‍රධාන ගැටළු, අලෙවි කිරීමේ ප්‍රතිපත්තිය හා අමු ද්‍රව්‍ය ලබා ගැනීම.

**මුදල් සහ බැංකු ක්‍රමය.**—මූල්‍ය ඒකකය, බැංකු ක්‍රම පිළිවෙළ, බද්ධ ව්‍යාපාර බැංකු ක්‍රමයේ සංවර්ධනය, මහා බැංකුවේ තත්ත්වය හා ඊට අයත් කටයුතු. බැංකු පොළී ප්‍රමාණය, විවට වෙළඳ කටයුතු, දීර්ඝ කාල හා කෙටි කාල පොළී අයකිරීම්, ලන්ඩන් ස්ටොක් ඇක්ස්චේන්ජය, ව්‍යාපාර වස්තු හා කොටස් සම්බන්ධ දේශීය ව්‍යවහාර.

හස්ත ලේඛනය (පැ. 2යි.)

ලිපියක් හෝ චක්‍රාකාර හෝ මුද්‍රිත සටහනක් හෝ වට්ටෝරුවක් හෝ පිටපත් කිරීම. ගණිත නිදර්ශනයක්, බිල් පත්‍රයක්, කුවිතාන්සියක්, සීට්ටුවක්, විදුලිය පණිවුඩයක් හෝ සාමාන්‍යයෙන් භාවිතය වන වාණිජ සටහනක් හෝ ලියවිල්ලක් හෝ පිටපත් කිරීම හා අවශ්‍ය නම් රූල් ගැසීම. ශීඝ්‍ර හෝ අන් ලිඛිත කරුණු හෝ ඒ ඒ ආකාර හා ප්‍රමාණයේ අක්ෂර යොදා නයනාකර්ෂණීය ලෙස ඉදිරිපත් කිරීම. රූල් නොමැතිව ලිවීම—ලියුම් කවර (ලිපිනය ආදිය). පෑන්සල පාවිච්චි නො කොට පෑනෙන් සරල අක්ෂර ලිවීම.

**සැලකිය යුතුයි.**—අක්ෂරවල ප්‍රමාණයේ, නම්නයේ ශෛලියේ හා අන්තරයන්ගේ සමතාව අපේක්ෂා කරනු ලැබේ. හැම අක්ෂරයක්ම පැහැදිලිව ද නිවැරදිව ද ගෝලාකාර කළ යුතු තැන් ගැන සැලකිලිමත්ව ද ලිය යුතුයි.

වාණිජ අංක ගණිතය. (පැ. 3යි.)

අනුපාතය, ඩිස්කවුන්ට්, ව්‍යාපාර වස්තු හා කොටස්, ලාභය හා අලාභය, වැල් පොළිය (ණය මුදල් ආපසු ගෙවන විට මෙය පාවිච්ච කරන ක්‍රමය ඇතුළු) ලඝු ගණක පාවිච්චිය (වැල් පොළිය, ඉන්ෂුවරන්ස් හා සංවත්සර මුදල් වෙනුවෙන් මෙය විශෙෂයෙන් යෙදීම), සවදේශීය හා විදේශීය ගණන් පත්‍ර පිළිබඳ ගනුදෙනුව හා විනිමය ගණන, මුදල් සම්පාදනය, මීටර ක්‍රමය හා අච්චු ගැසූ මුදල් කාසි, සංඛ්‍යා ලේඛන ප්‍රස්තාර මධ්‍යය පදය හා ප්‍රමාණ උල්ලංඝනය.

**සැලකිය යුතුයි.**—ලඝු ගණක චක්‍ර පාවිච්චි කිරීමට ඉඩ දෙනු ලැබේ. (මේ ප්‍රශ්න පත්‍රයෙහි අභ්‍යාස පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රශ්නවලට වඩා අමාරු වේ.)

ගණනාධිකරණය (පැ. 3යි.)

(එහි මූල ධර්ම)

(1) තනි සටහන් : තනි සටහන් යන්නෙහි තේරුම. තනි සටහන් ක්‍රමයේ අසම්පූර්ණත්වය, භාවිත කරණ පොත්.

(2) ද්විත්ව සටහන් : ද්විත්ව සටහන් පිළිබඳ සිඩාන්තය, විද්‍යානුකූල ක්‍රම, සියලුම වර්‍ගවල වාණිජ ගනුදෙනු සඳහා යොදාගත හැකි වීම. තනි සටහන් ක්‍රමයට වඩා කොපමණ උසස් ද යන වග.

**භාවිත කරන පොත්.**—නොයෙක් වර්‍ගවලට අයත් මුදල් පොත් වලින් ඇති ප්‍රයෝජන, විකුණුම් පොත්, ගැණුම් පොත්, ජර්නල, ලැජර්, අතිරේක පොත් නොයෙක් ව්‍යාපාර සඳහා භාවිත කරන විශෙෂ පොත් සවයං තුලන ලැජර් සම්බන්ධ "අනුශීර්ෂ ක්‍රමය" හා "අනුභාග ක්‍රමය".

**ව්‍යවහාර වන ශබ්ද.**—ප්‍රාග්ධනය, ණය, ණයකර, උකස් අයිරාව, ණය හිමියෝ, පෞද්ගලික හා අපෞද්ගලික හෙවත් නාම මාත්‍ර ගිණුම්, ගෙවිය යුතු බිල්, අයවිය යුතු බිල්, වට්ටම්, පොළී, ණයතුරුස්, වත්කම්, ණයකරුවෝ, ව්‍යාපාර වස්තු, ලාභාලාභ, කොටස් (සාමාන්‍ය, වර්ණිය, විලම්බිත) කුලී, රාජ්‍යභාග, බදුදීම්, වාරිකයෝ, ක්ෂයවීම්, නිදන් අරමුදල්, වෙන්කිරීම්, යන්ත්‍රෝපකරණ, නියමිත අය කිරීම්, **බිම් සකස් කිරීම්**, ශඝය, නියෝජන, ආයෝජන, සංචිත අරමුදල් ආදී භාවිතයට ගන්නා ශබ්දයන්හි තේරුම හා ඒවායෙහි සවභාවය. **පොත් තුලනය.**—නියමිත කාල පරිච්ඡෙදයන්හි පොත් තුලනය සඳහා භාවිත කරන ක්‍රම, වෙළඳාමේ ගිණුම් පිළියෙල කිරීම, ලාභාලාභ ගණන් හා ශේෂ පත්‍ර.

**යම් ව්‍යාපාරයක් පිළිබඳ ඇති වන වෙනස්වීම්.**—වුවමනා පොත්, ඒ පොත් තබාගන්නා ක්‍රම හා සාප්පුකාරයන්, වෙළෙන්දන්, නිෂ්පාදකයන්, නාගරික බල මණ්ඩල, ආරක්ෂණ සමාගම්, නැව් හිමියන්, බ්‍රෝකර්වරුන්, බද්ධ ව්‍යාපාර වස්තු, වෙළඳ සමාගම්,—විශේෂයෙන් ව්‍යාපාරයක් ගැනීම, නිම කිරීම හා සම්බන්ධනය-ආදී නොයෙක් ව්‍යාපාර සම්බන්ධයෙන් ගණන් ඉදිරිපත් කරන පිළිවෙළ.

ටයිප් ගැසීම (පැ. 3යි.)

(i) කාර්මික වාණිජ හා නෛතික සටහන් හා චක්‍රාකාර සටහන් ආදිය පිළිබඳ එක් එක් තරාතිරමේ දුරවබෝධ පාඨ පිටපත් කිරීමට ද,

(ii) කියවන්නට අපහසු අකුරු පැහැදිලි ලෙස නො ලියන ලද අත් පිටපතක් ටයිප් ගැසීමට ද අයදුම්කරුවන්ට දෙනු ලැබේ. ටයිප් රයිටිං පිටපත් කිරීමේ දැනීමක් අයදුම්කරුවන්ට තිබිය යුතුයි. ටයිප් ගසන්නකු විසින් දැනගත යුතු සාමාන්‍ය විෂයයන් ප්‍රශ්න පත්‍රයට ඇතුළත් කරනු ලැබේ. විනාඩි 10ක වේග පරීක්ෂණයක් ද ඇතුළත් කරනු ලැබේ. යටත් පිරිසෙයින් විනාඩියකට වචන 25ක වේගයක් බලාපොරොත්තු වනු ලැබේ.

ඕනෑම වර්ගයේ ටයිප් ගසන යන්ත්‍රයක් (ටයිප් රයිටරයක්) පාවිච්චි කිරීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු ලැබේ. **ටයිප් ගසන යන්ත්‍ර (ටයිප් රයිටර) සපයනු නොලැබේ. එනිසා අයදුම්කරුවන් විසින් තමන්ගේ ටයිප් ගසන යන්ත්‍ර (ටයිප් රයිටර) විභාගය සඳහා ගෙන ආ යුතුය.**

**ලඝු ලේඛනය.**—විනාඩියකට වචන 70ක වේගයෙන් විනාඩි 5ක් තුළ කියවන ලද ඡෙදයක් ද, විනාඩියකට වචන 80ක වේගයෙන් විනාඩි 5ක් තුළ කියවන ලද තවත් ඡෙදයක් ද ලඝු ලේඛනයෙන් ලියාගෙන එම ඡෙද දෙක සාමාන්‍ය විධියට (දීර්ඝ ලේඛනයෙන්) පිටපත් කිරීම. මෙසේ පිටපත් කිරීමට වචන 7කට විනාඩියක් බැගින් දෙනු ලැබේ.

අයදුම්කරුගේ දක්ෂතාව මැනීමේදී අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා පිටපත් කිරීමේ ශොභනත්වය ගැන සලකනු ලැබේ.

9. **වෙනත් කරුණු.**—මේ ව්‍යවස්ථාවන්හි සඳහන් නො වූ යම්කිසි කරුණක් ඇත්නම්, එය විභාග කොමසාරිස් තැනට අභිමත පරිදි විසඳනු ලැබේ.

10. මේ විභාගය පවත්වනු ලබන්නේ සිංහල භාෂාමය වාණිජ සහතික පත්‍ර විභාග මණ්ඩලයේ නිර්දේශයන් අනුවය. නියමිත පරිදි සමත්වන සියලුම අයදුම්කරුවන්ට මෙම මණ්ඩලය මගින් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

කනකරත්න ගුණතුංග,
විභාග කොමසාරිස්.

වර්ෂ 1958ක් වූ නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ විභාග
දෙපාර්තමේන්තුවේ දී ය.

---

## කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාල සහතික පත්‍ර අභ්‍යාසය

කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයෙහි දෑවුරුදු සහතික පත්‍ර අභ්‍යාසය සඳහා කාන්තාවන් වෙනුවෙන් පුරප්පාඩු කීපයක් තිබේ.

අභ්‍යාස විද්‍යාලයට ඇතුළත්වීමට කැමති කාන්තාවන්ගෙන් ඉල්ලුම් පත්‍ර පහත සඳහන් සුදුසුකම් ඇති බව සඳහන් කොට 1958 නොවැම්බර් 22 වැනි ශනි දින දහවල් 12 ට පෙර කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැනට (තැ. පෙ. 58, මහනුවර) එවිය යුතුයි :—

(1) 1958 ඔක්තෝම්බර් මස 1 වැනි දින වන විට ඔවුන්ගේ වයස අවුරුදු 17 ටත් 23 ටත් අතර විය යුතුය.

(2) රසායනික විද්‍යා හෝ වෙනයම් විද්‍යාත්මක විෂයයක් සමග ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ උගැන්වීමේ මාධ්‍යය සිංහල සහ දෙමළ වනු ඇත. සිංහල හෝ දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන දේශනා පංක්තිවල උගෙනීම ලැබ සිංහල හෝ දෙමළ භාෂාවෙන් පාඨ පරීක්ෂණවලට පෙනී සිටීමේ හැකියාවක් අයදුම්කරුවන් තුළ තිබිය යුතුය.

ඇම්. ඈෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1958 නොවැම්බර් 3 දා,
පේරාදෙණියේ දී ය.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය තැ. පෙ. 500, කොළඹ 1), පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දින යන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

(1) ගෝනි නූල් සැපයීම.—58.12.16 ද ;

(2) මෙරට සෑදූ ලෝම දිග මේස් සහ කොට මේස් සැපයීම.—58.12.23 ද.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටිමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දින වලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැ. 14 වැනි දින,
කොළඹදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වැලිසර ආවුධ කම්හලේ විදුලි කම්බි ඇදීම

වැලිසර ආවුධ කම්හලේ විදුලි කම්බි ඇදීම සඳහා 1958.12.12 දින සවස 2.30 දක්වා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. වයර් ඇදීම පහත සඳහන් අන්දමට සිදු කළයුතු අතර ටෙන්ඩර් භාරගන්නේ ඒ සඳහා ලියා පදිංචි කළ අයගෙන් පමණි.

මේ ගැන වැඩි විස්තර මෙම ගැසට් පත්‍රයේ අන්තැනක පළවෙන ඉංග්‍රීසි පරිවර්තනයෙන් බලා ගන්න.

2. වයර් ඇදීම පහත සඳහන් අන්දමට කළ යුතු යි. එය වෝල්ට් 400/200, කලා 3, චක්‍ර 50 ඒ. සී., විය යුතු අතර විදුලි බල සැපයීමේ දෙපාර්තමේන්තුවේ හා එංගලන්තයේ විද්‍යුත් ජනක හා ගොඩනැගිලි පිළිබඳ ආයතනය මගින් පිළිගත් රෙගුලාසි අනුව කළ යුතු යි. විදුලි කම්බි ආවරණය කළ යුතු යි.

3. මෙම වැඩය මෙම දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු තැන විසින් අණ කරන අන්දමට කළයුතු අතර එය එම ඉංජිනේරු තැන නැති නම් ඔහුගෙන් බලයලත් නිලධාරියෙකුට සෑම සුදුසු අවස්ථාවකම පරීක්ෂාකිරීමට ඉඩ තැබිය යුතුය.

4. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් පෝරම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලු ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා, "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "වැලිසර ආවුද කම්හලේ විදුලි කම්බි ඇදීම" යන්න ලියා එවිය යුතුයි.

5. ටෙන්ඩර පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියට දැමිය යුතුයි. එසේ නැතිනම් රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර පත්‍ර රෙජිස්ටර තැපැලෙන් නොඑවනහොත් ටෙන්ඩර කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර පත්‍ර භාර ගැනීමට බලය ඇති නිලධාරියා වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් පිළිබඳව වැඩ කරන ලිපිකරු මහතාට ඒවා අතින්ම බාර දිය යුතුයි. ටෙන්ඩර පත්‍ර බහාලන කවරයෙහි "වැලිසර ආවුද කම්හලේ විදුලි කම්බි ඇදීම" යන්න ලියා ටැන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

6. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නො ලැබුණොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර පත්‍ර මණ්ඩලයේ සභාපති තැන ගෙන් ඒ ගැන වහාම විමසිය යුතුයි. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර පත්‍රයේ ලිවිය යුතුයි.

7. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටිමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් යම් ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර පත්‍රයක අනුපිටපත සෝදිසි කිරීමට ඉඩ දෙනු ලැබේ. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර පත්‍ර මණ්ඩලයේ සභාපති තැන සමඟ පිළියෙල කර ගත යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දින දහයක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පතේ මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

9. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ. ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලන මුදල් ගණන අකුරෙනුත් ඉලක්කමෙනුත් ලිවිය යුතුයි. මිල සඳහන් කළ යුත්තේ රේගු ගාස්තු රහිත කොළඹදී දුම්රිය පෙට්ටිවලට පැටවීමට යන ගණන්ය.

10. ටෙන්ඩර පත්‍රයේ සඳහන් කරන සියලු මිළ ගණන් යටත් පිරිසෙයින් සති හයකටවත් වෙනස් නොවන සිර ඒවාද විය යුතුයි. සෑම ටෙන්ඩර්කරුවෙකු විසින් ම ඉහත සඳහන් විදුලි කම්බි ඇදීම නිම කිරීමට හැකිවේයයි සිතන දිනය හෝ කාලය ටෙන්ඩර පත්‍රයේ සඳහන් කළ යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූ ද පිළිගනු ලැබුවාවූ ද මුලු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය ආණ්ඩුව වෙත තබා ගනී.

13. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ රටවැසියෙකු වූ තැනැත්තෙක් යන්නයි.

14. 1934 රේ 19 වැනි කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම වැඩය කිරීමට තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් හැකිතාක් දුරටම වැඩය කර ගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොට ගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාගෙන් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ මාර්ගයෙන් ලබා ගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් බලය දෙන ලද නිලධාරියකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමට බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

17. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන් නොත්, නැතහොත් ඔහු කියා ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවොත්, නැතහොත් ඒ ලිපිනයේ ඇති ස්ථානයේ ගෙන ගොස් තැබුවහොත් ඔහු අතටම භාර දුන්නා කොට සලකනු ලැබේ.

18. කෘෂිකර්ම අධ්‍යක්ෂතැනට උවමනා යයි පෙනී ගියොත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ඇපකරුවෙකු හෝ ඊට වැඩි ගණනක් සොයාගෙන ඔහුගේ වියදමින් ම ඔවුන් ලවා පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානම් විය යුතුයි. මේ ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන ලවා අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. නිම කරන ලද වැඩය සතුටුදායක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට තබා ගනු ලැබේ.

21. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් දැන ගත හැක. එසේ යවන ලියුම් ඒ නිලධාරි තැනගේ රාජකාරි ලිපිනයට මිස පුද්ගලිකව නො එවිය යුතුයි.

කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1958 නොවැම්බර් මස 5 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ඩීසල් යන්ත්‍ර සැපයීම

කොළඹ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1958.12.19 වැනි දින සවස 2.30 දක්වා පහත සඳහන් යන්ත්‍ර සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

රේඩියේටරයක් මගින් ශීත කරණ, අශ්වබල 54 කට නො අඩු නිත්‍ය බල වේගයක් ඇති, මිනිත්තුවකට පරිභ්‍රමන 1,000ක ක්‍රියාකාරිත්වයකින් යුත්, ඩීසල් තෙල්වලින් ක්‍රියා කරන, විදුලි බලය මගින් ක්‍රියා කිරීමට සැළැස්විය යුතු අතර, එයට බැටරියක් ද සැපයිය යුතු යි. තෙල්වල පීඩනය දක්වන මානක යන්ත්‍රයක් ද, වතුර වල උෂ්ණය දක්වන තාප මානක යන්ත්‍රයක් ද, ටැකෝ මීටරයකින් ද සමන්විත විය යුතු යි. යන්ත්‍රය ක්‍රියා කරවන තෙල් දැමීමට ටැන්කියක් ද එයට තිබිය යුතු අතර, කේ. වී. ඒ. 40ක පරිවර්තක යන්ත්‍රයකට සුදුසු පරිදි එය කට්ටලයක් මත ගොඩනැගිය යුතු යි. යන්ත්‍ර 2ක් අවශ්‍ය ය. (මේ ගැන විස්තර කරුණාකර මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි පරිවර්තනයෙන් බලා ගන්න).

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් පෝරම කොළ ලබා ගෙන ටෙන්ඩර පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළු ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඩීසල් එන්ජින් යන්ත්‍ර සැපයීම" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩරපත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියට දැමිය යුතුයි. එසේ නැතිනම් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර පත්‍ර භාරගැනීමට බලය ඇති නිලධාරියා වන කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට ඒවා අතින්ම බාර දිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර බහාලන කවරයෙහි "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඩීසල් එන්ජින් යන්ත්‍ර සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩරපත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩරපත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩරකරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණ හොත් ඔහු කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩරපත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන වහාම විමසිය යුතුයි. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩරපත්‍රයේ ලිවිය යුතුයි.

5. ටෙන්ඩර කරුවන්ට උවමනා නම් ටෙන්ඩරපත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩරපත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේදී කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ දී ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර කරුවන්ට උවමනා නම් යම් ටෙන්ඩර කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර පත්‍රයක අනුපිටපත සෝදිසි කිරීමට ඉඩ දෙනු ලැබේ. මෙය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර පත්‍ර මණ්ඩලයේ සභාපති තැන සමග පිළියෙල කර ගත යුතුයි.

6. ටෙන්ඩරපත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ දවල් 12 වනතෙක් ටෙන්ඩර පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩරපත්‍රයක් වෙනුවෙන් රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දින දහයක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට ද ඉඩ තිබේ.

7. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර පත්‍රයක්, ටෙන්ඩර පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර කරුගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ. ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලන මුදල් ගණන අකුරෙනුත් ඉලක්කෙමෙනුත් ලිවිය යුතුයි. මිල සඳහන් කළ යුත්තේ රේගු ගාස්තු රහිත කොළඹ දී දුම්රිය පෙට්ටිවලට පැටවීමට යන ගණන් ය.

8. පුළුවන් කමක් තිබේ නම් ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන් විසින් ටෙන්ඩර් කරනු ලබන දේ සම්බන්ධයෙන් ක්‍රියාකරන්නාගේ අත් පොත (Operator's Handbook) වැඩ පළ සංග්‍රහය (Workshop Manual) සහ යන්ත්‍රෝපකරණ වල වැඩිපුර උවමනා කරන කොටස්වල මිල ගණන් සඳහන් ලැයිස්තුවක් ද (Priced Spare Parts List) සැපයිය යුතුයි. ටෙන්ඩර්කරුවන් විසින් සාදන්නාගේ සහතික කරනු ලබන කාලය සහ නොමිලයේ සේවා කරදෙන කාලය (Period of Free Service) සඳහන් කළ යුතුයි.

9. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරන සියලු මිළ ගණන් යටත් පිරිසෙයින් සති හයකටවත් වෙනස් නොවන සථිර ඒවාද විය යුතුයි. සෑම ටෙන්ඩරකරුවකු විසින්ම ඉහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීමට හැකිවේ යයි සිතන දිනය හෝ කාලය ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුයි.

10. ටෙන්ඩර පත්‍රයේ සඳහන් වූ ද පිළිගනු ලැබුවා වූ ද යන්ත්‍රෝපකරණවල මුළු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසිපරිදි ඉටුකොට නිම වූ විට පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරනු ලැබූ ටෙන්ඩර කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩරපත්‍රයක් හෝ සියළු ටෙන්ඩරපත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩරපත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය ආණ්ඩුව වෙත තබා ගනී.

12. ලාංකික වෙළඳුන්ට පමණක් වෙළඳාම් කිරීමට සීමා කරන ලද රටවලින් එනම් ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චැකොස්ලොවේකියාව, එස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුවේනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, රුසියාව සහ යුගෝස්ලේවියාව ආදී රටවලින් බඩු ගෙන්වා සැපයීමට අදහස් කරන ටෙන්ඩරකරුවන් බඩු ගෙන්වීමේ පාලක නිලධාරි තැනගේ සාමාන්‍ය බඩු ගෙන්වීමේ බලපත්‍රයක් ලත් ලාංකික වෙළෙන් දන් විය යුතුයි.

13. පත්කරනු ලැබූ ටෙන්ඩරකරුවා විසින් ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

14. 1934රේ 19 වැනි කම්කරු වන්දි ආඥාපනතේ (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමට බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

16. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්හොත්, නැතහොත් ඔහු කියා ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත්, නැතහොත් ඒ ලිපිනයේ ඇති ස්ථානයේ ගෙන ගොස් තැබුවහොත් ඔහු අතටම භාර දුන්නා කොට සලකනු ලැබේ.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට උවමනායයි පෙනී ගියොත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ඇපකරුවෙකු හෝ ඊට වැඩි ගණනක් සොයා ගෙන ඔහුගේ වියදමින් ම ඔවුන් ලවා පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානම් විය යුතුයි. මේ ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන ලවා අනුමත කළ යුතුයි.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

19. සපයන ලද යන්ත්‍රොපකරණ සතුටුදායක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනට තබාගනු ලැබේ.

20. වැඩි විස්තර පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් දැන ගත හැක. එසේ යවන ලියුම් ඒ නිලධාරි තැනගේ රාජකාරි ලිපිනයට මිස පුද්ගලිකව නො එවිය යුතුයි.

කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

1958.11.7, පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් කිලිනොච්චියේ ගොවිපලේ අක්කර 50ක බිම් ප්‍රමාණයක් මට්ටම් කර නියර බැඳීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 5 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ. මෙම වැඩය 1959 යේ ජූනි 30 වැනි දිනට පෙර නිම කළ යුතුයි.

2. යාපනේ කෘෂිකර්ම කායඝීලයේ පාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොණෙහි "කිලිනොච්චියේ අක්කර 50ක් මට්ටම් කිරීම හා නියර බැඳීමේ ටෙන්ඩර්පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව කටයුතු කරණ ලිපිකරු තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "කිලිනොච්චියේ අක්කර 50 මට්ටම් කිරීම හා නියර බැඳීමේ ටෙන්ඩර්පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළයුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදී ම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්. ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූ ද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

11. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

12. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාරදුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කායඝීලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගතහැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1958 නොවැම්බර් මස 8 වැනි දින,
පේරාදෙණියේ දී ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වාරියපොල, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැන විසින් බතලගොඩ ආණ්ඩුවේ ගොවිපලෙහි ඇති පොල් 30,000ක් පමණ විකිණීම සඳහා සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 5 වෙනි දින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කායඝීලය, වාරියපොල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපොලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචිකළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර්පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළයුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කරගත යුතුයි. එසේ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්වන්නට ඉඩ තිබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිළි ලෙස තින්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිළි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවාගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළු දන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැණීමට නුසුදුසු යයි කල්පනාකරනු ලබන යම්කිසි කම් කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුඬවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුඬවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුඬවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල් වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කරගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ ආණ්ඩුවේ ගොවිපළ භාර කළමනාකාරතැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

1958 නොවැම්බර් 5 වෙනි දින,
පේරාදෙණියේ දීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් රෝහලට ජල සම්පාදන සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1958 දෙසැම්බර් මස 9 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

1. බලපිටිය රෝහලට ජලය සැපයීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1958 දෙසැම්බර් 5 වැනි සිකුරාදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 75,000 වඩා වටිනාකම ඇති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකත් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයැදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහාලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ අංක 155 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තුමාට බාරදිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිටෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
දිනය : 11.11.58.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයේ (තැ. පෙ. 500) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් රෝහලට ජල සම්පාදනය සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1958 දෙසැම්බර් මස 9 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) මහවල තැන්න රෝහලට ජලය සැපයීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1958 දෙසැම්බර් 5 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 20,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ ලියා පදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකත් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයැදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහාලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරි තුමාට බාරදිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
දිනය : 11.11.58.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### විදුලි ලාම්පු සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1958 ක්වූ දෙසැම්බර් මස 24 වන බදාදා පූ. භා. 9.30 දක්වා ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කායාීලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරම වලයි. වර්ෂ 1958 ක්වූ දෙසැම්බර් මස 19 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1958ක්වූ දෙසැම්බර් මස 24 වන දින පූ. භා. 10 ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කායාීලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන
කළමනාකාර තැන.

1958ක්වූ නොවැම්බර් මස 14 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

25.9.58 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් දැන්වීම සම්බන්ධවයි. "ස්ටේෂන්" වැගන් රථය සඳහා පිළියෙල කරන ලද විස්තර පත්‍රිකාව මදක් වෙනස්කර ඇති බවත්, ටෙන්ඩර්කරුවන්ට එය ඉල්ලුම් කළ විට ලබාගත හැකි බවත්, මෙයින් දැනුම්දෙමි.

සී. ජී. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1958 නොවැම්බර් මස 6 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායාීලයේදීය.

---

## රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනය

### මෝටර් රථයක් විකිණීම

රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ ප්‍රධාන ඉංජිනේරු තැන විසින් අංක සී. ඊ. 8199 දරණ, මූලික කාර්මික අභ්‍යාස ආයතනයට අයත් පාවිච්චි කළ නොහැකි ඩොජ් ලොරිය විකිණීම සඳහා සීල් තබන ලද ටැන්ඩර් පත්‍රිකා 1958 දෙසැම්බර් මස 15 වැනි සඳුදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ. එම ටැන්ඩර් පත්‍රිකා බහාලන කවරයෙහි පිට "මෝටර් රථය මිලයට ගැනීම සඳහා ටැන්ඩර්" යනු සඳහන් කළයුතුයි.

2. මෙම රථය මිලට ගැනීම සඳහා ඉල්ලුම් කළයුත්තේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ටැන්ඩර් පත්‍රිකාවල පමණක්ය. කච්චේරියක, රජයේ භාණ්ඩාගාරයේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් පණහක් තැන්පත් කොට ලබාගන්නා ලද එම කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කළවිට හෝ රෙජිස්ටර් තැපැලෙන් එවූ විට ටැන්ඩර් පත්‍රිකාවක් සපයනු ලැබේ. තෝරාගන්නා ලද ටැන්ඩර්කරු විසින් තමන්ගේ ටැන්ඩර් පිළිගත් බැව් දන්වා එවූ දිනයේ සිට දින හතක් ඇතුලත දී සම්පූර්ණයෙන් මුදල් ගෙවා රථය රැගෙන යා යුතුයි. එසේ දින හතක් ඇතුලත මුදල් නොගෙව්වොත් ටැන්ඩර් සඳහා ගෙවන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ටැන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ 1958 දෙසැම්බර් 9 වැනි අඟහරුවාදා දවල් 12 වන තෙක් පමණී. මෙම මෝටර් රථය සෙනසුරාදා දිනයන් හැර සතියේ දිනයන් හි උදේ 9 සිට සවස 3.30 දක්වා කාලය තුල රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේදී පරීක්‍ෂා කළහැක. ටැන්ඩර්, රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ටැන්ඩර් පත්‍රිකා, 1958 දෙසැම්බර් මස 15 වැනිදා උදේ 10ට රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේදී විවෘතකරනු ලබන අතර ටැන්ඩර් කරුවන්ටද එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

බී. ඩබ්ලිව්. සොයිසා,
ප්‍රධාන ඉංජිනේරු,
මූලික කාර්මික අභ්‍යාස ආයතනය.

රත්මලාන,
14. 11. 1958

---

## පඩරල්දෙනිය ජනපදයෙහි ලිං සෑදීම

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ පඩරල්දෙනිය ජනපදයෙහි ලිං සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 8 වෙනිදා දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 5 වෙනි දින දහවල් 12 දක්වා මහනුවර කච්චේරියෙන් ලබාගත හැක.

ජී. ද සොයිසා,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

---

අංකය : ඇල් ඇල් සී/1447

## ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය දෙපස තිබෙන තාවකාලික වෙළඳසැල් (කඩ) බදු දීම

ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය දෙපස තිබෙන මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම්, 1959යේ වන්දනා කාලයේ දී තාවකාලික වෙළඳසැල් (කඩ) පැවැත්වීම සඳහා බදු දීම පිණිස මුද්‍රාව (සීල්) තබනලද ඉල්ලුම් "ටැන්ඩර්" රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් භාරගනු ලැබේ. එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතුවේ.

2. "ශ්‍රී පාදස්ථානයට යන මාර්ගයේ වෙළඳසැල් පැවැත්වීම සඳහා" යන වචන ලියුම් කවරයේ ලියා මුද්‍රාව තබන ලද ඉල්ලුම් පත්‍ර 1958 දෙසැම්බර් 10 වැනි දින පෙරවරු 10.30 වනතුරු භාරගෙන ඒ වේලාවට එම ලියුම් කඩා බලනු ලැබේ. ඉල්ලුම් පත්‍රයන්හි සත්‍යතාවය ඔප්පු කිරීම පිණිස ඉල්ලුම්කරු හෝ ඔහුගෙන් බලය ලත් ඒජන්ත කෙනෙක් ඒ වේලාවේ මෙම කච්චේරියට පැමිණිය යුතුයි.

3. තෝරාගන්නා ලද ඉල්ලුම් පත්‍රයන්හි සඳහන් සම්පූර්ණ මුදල ඉල්ලුම්කරුවන් විසින් එවලේම ගෙවා බලපත්‍ර ලබාගත යුතුයි.

4. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය දිසාපති තුමා වෙත තබාගන්නා ලදී.

5. යම්කිසි ඉඩම් කැබැල්ලක් සඳහා ලැබී තිබෙන ඉල්ලුම් පත්‍ර නුසුදුසුවේ නම්, එවැනි ඉඩම් බදු වෙන්දේසි කිරීමේ බලය දිසාපති තුමා වෙත වේ.

6. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විසින් තම වෙළඳසැලේ තිබෙන සෑම කෑම ද්‍රව්‍ය මැස්සන්ගෙන් ප්‍රවේසම්වීම සඳහා සුදුසු ආවරණ තැබිය යුතුයි. එසේ නොකළහොත් එම බදුකරය අවලංගු කිරීමට දිසාපති තුමාට බලය තිබේ.

7. තෝරාගනු ලැබූ සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම තමා විසින් සාදන සෑම වෙළඳ සැලක් සඳහා සෞඛ්‍ය නිලධාරීන් විසින් අනුමත කරන පරිදි සිමෙන්ති කක්කුස්සි ලැලි තබනලද වැසිකිලියක් බැගින් සෑදිය යුතු වේ. එසේ කිරීමට ඇප වශයෙන් රුපියල් 25ක් එම ඉල්ලුම්කරු විසින් තැන්පත් කළ යුතුයි. 1959 ජනවාරි 1 වැනිද සින් පෙර එවැනි වැසිකිළි තැනුවහොත් ඒ මුදල ආපසු දෙනු ලැබේ. එසේ නොකළහොත් වැසිකිළි තැනීම සඳහා එම මුදල පාවිච්චි කරනු ලැබේ.

8. බදු ගන්නාලද සෑම ඉඩම් කැබැල්ලකින්ම 1959 ජූනි 1 වැනි දැසින් පෙර අස්විය යුතුයි.

9. වැඩි විස්තර උවමනා කෙරේ නම්, රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමාගෙන් දැනගත හැක.

### උපලේඛනය

(1) නිලිහෙල බිම් කැබලි 2යි ; එකක් මාගීය යටිපැත්තේ, අනික අම්බලමට යාව,

(2) ගැටනැතුල, ඉඩම් කැබලි 1යි,

(3) ඉදිකටුපාන ගල්පොත්ත, ඉඩම් කැබලි 1යි,

(4) මැල්ලමලකඳුර, ඉඩම් කැබලි 1යි,

(5) පාවනැල්ල, ඉඩම්කැබලි 1යි,

(6) එරත්න-තුම්මෝදර, ඉඩම් කැබලි 2යි ; එකක් එරත්න තුන් මෝදර, අනික තුන්මෝදර ගඟින් එතර එරත්න පාර,

(7) ධම්රාජගල, ඉඩම් කැබලි 1යි,

(8) මැදහින්න, ඉඩම් කැබලි 1යි,

(9) සීතගඟුල, ඉඩම් කැබලි 1යි,

(10) එරත්න පාරේ බේරුමණ්ඩිය ගල්ලෑල්ල, ඉඩම් කැබලි 1යි,

(11) ගැටනඇතුල ඉස්මත්ත කොඩිය ගාව, ඉඩම් කැබලි 1යි,

(12) හැරම්පිපාන සහ මැල්ලමලකඳුර අතර ගෝනතැන්න, හෙල තැන්න ඉඩම් කැබලි 1යි,

(13) මස්කෙලිය ගඟ අසල 436 ප්ලෑනේ ලොට් නො 5 ඉඩම් කැබලි 1යි,

(14) ඉදිකටුපාන-එරත්නපාර, ඉඩම් කැබලි 1 යි,

(15) ඉහල පාවනැල්ල සහ නිලිහෙල අතර බුලත්වෙල් ඩෝවේ අඩිපාර ශ්‍රී පාදස්ථාන පාරට වැටෙන ස්ථානය,

(16) පරතලකන්ද-326 ප්ලෑනේ ලොට් නො. 22සී, ඉඩම් කැබලි 1 යි,

(17) ආඩියමලතැන්න, ඉඩම් කැබලි 1 යි,

(18) ගුරුගල්හෙල ඉස්මත්ත, ඉඩම් කැබලි 1 යි,

(19) දෙමලහින්න තැන්න, ඉඩම් කැබලි 1 යි,

(20) දිය බැත්මේ නෝනගේ අම්බලම ලඟ, ඉඩම් කැබලි 1 යි,

(21) පාවනැල්ල-433 ප්ලෑනේ ලොට් නො. 30, ඉඩම් කැබලි 1 යි,

(22) මාපනාන-435 ප්ලෑනේ ලොට් නො. 5, ඉඩම් කැබලි 1 යි,

(23) ගුරුළුවාන-349 ප්ලෑනේ ලොට් නො. 151, ඉඩම් කැබලි 1 යි,

(24) සුදුවැල්ල-හීන්ගඟුල, ඉඩම් කැබලි 1 යි,

(25) හැරම්පිපාන, ඉඩම් කැබලි 1 යි.

එච්. කරුණාජීව,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

1958 නොවැම්බර් 4 දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

### රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලේකන්ද වසමේ ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දෙන ලද ඉඩම් කට්ටි වලට ජල නල මාර්ගයක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් පල්ලේකන්ද වසමේ ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දෙන ලද ඉඩම් කට්ටි වලට ජල නල මාර්ගයක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් පළමුවැනි දින උදේ 9.30 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර්කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ රුපියල් 4,000කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

2. ටැන්ඩර් පෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රු. 50 මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් පෝරම 1958 නොවැම්බර් මස 24 වැනි දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබා ගත හැක.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1958 නොවැම්බර් මස 24 වැනි දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1958.11.5
රත්නපුර කච්චේරියේ දීය.

---

### කෑගල්ල දිසාවේ සුළු වාරි කර්මාන්ත

කෑගලු දිසාවේ රජයේ දිසාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 10 වැනි බදාදා පෙරවරු 10 දක්වා පහත සඳහන් සුළු වාරිකර්මාන්ත සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) පරණකූරු කෝරළේ හකුරුගම්මන, බෝවල්ගහ නින්දර දෙනියේ අමුණ අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම ;

(2) පරණකූරු කෝරළේ සැලව පරගහමුල අමුණ අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම ;

(3) පරණකූරු කෝරළේ පල්ලේගම උඩපිටියේ අමුණ අළුත් වැඩියා කිරිම හා වැඩි දියුණු කිරීම ;

(4) පරණකූරු කෝරළේ උඩගම කුකුල්පිටිය අමුණ අළුත්වැඩියා කිරීම ;

(5) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ පරපේ රාල්ලාගේ අමුණට ලෑලි සැපයීම ;

(6) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ හීනාබෝවේ නාවතේ අමුණ බැඳීම ;

(7) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ හීනාබෝවේ ගල්ගේදෙනිය ඇල අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම ;

(8) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ පිටියේගම ගල්අමුණ බැඳීම ;

(9) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ තම්මිට මහ අරඹේ උඩ අමුණ බැඳීම ;

(10) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ තඹවිල ගල් අමුණ බැඳීම ;

(11) බෙලිගල් කෝරළේ නාරන්ගොඩ කිරිවත්දෙනිය අමුණ බැඳීම ;

(12) බෙලිගල් කෝරළේ මාහේනේ හලල්ලේ මූකලානේ අමුණ බැඳීම ;

(13) දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම පිලවල, පිලවල අමුණ බැඳීම ;

(14) අටුලුගම් පනාවල් දෙකෝරළේ බේන්දලුවේ ගොරගහවත්ත අමුණ බැඳීම ;

(15) අටුලුගම් පනාවල් දෙකෝරළේ පත්බේරියේ මුගුනේ ඇල අමුණ අළුත්වැඩියා කිරිම ;

(16) අටුලුගම් පනාවල් දෙකෝරළේ මීගස්තැන්නේ ඉන්දෙල අමුණ බැඳීම ;

(17) ගල්බඩ කිණිගොඩ දෙකෝරළේ කඩිගමුවේ පැල්ගොඩයාය අමුණ බැඳීම.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රිකාවක් රු. 10 බැගින් කෑගල්ලේ කච්චේරියේ වර්ෂ 1958වේ දෙසැම්බර් මස 8 වැනි දින පස්වරු 3 දක්වා තැන්පත් කිරීමෙන් පසු ලබාගතහැකි මේ පිළිබඳ නියමිත අංකෘතිපත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සම්බන්ධ වැඩි විස්තර කෑගල්ලේ කච්චේරියෙන් දැනගත හැක.

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
කෑගලු දිසාවේ රජයේ දිසාපතිතැන.

වර්ෂ 1958වේ නොවැම්බර් මස 7 වැනි දින
කෑගල්ලේ කච්චේරියේ දීය.

---

### ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ, මධ්‍යම බැංකුවේ මුදල් භාණ්ඩාගාරයේ විශේෂ අළුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 3 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ, බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ නොවැම්බර් මස 28 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

3. වෂී 1958වේ නොවැම්බර් මස 28 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ජලය සැපයීමේ වැඩ සඳහා රුපියල් 65,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදීය.
58.11.11.

---

කළුතර කටුකුරුන්දේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ගොඩනැගිලිවල වහල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1958වේ දෙසැම්බර් මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1958වේ නොවැම්බර් මස 28 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,56,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදීය.
58.11.11.

මාහෝ විධායක ඉංජිනේරු තැනට නිවාසයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1958වේ දෙසැම්බර් මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාහෝ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1958වේ නොවැම්බර් මස 28 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 60,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදීය.
58.11.11.

---

# බඩු බාහිරාදිය විකිණීම

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ, නාරාහේන්පිට ගොවිකම් කායඝිලයේදී, 1958 නොවැම්බර් මස 24 වෙනි දින පෙරවරු 10 ට ප්‍රසිඬ වෙන්දේසියේ ගව දෙනුන් 7ක් විකුණනු ලැබේ.

එම දෙනුන් ඉහත සඳහන් දින වෙන්දේසියට ප්‍රථම, කොළඹ නාරාහේන්පිට ගොවිකම් කායඝිල භූමියේදී සෝදිසි කර බැලීමට පුළුවන.

වෙන්දේසියෙන් ගත් දෙනුන්ගේ වටිනාකම මුදලින්ම ගෙවා එවේලේම ගෙනයායුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

1958 නොවැම්බර් මස 5 වැනිදා,
පේරාදෙණිය.

---

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.